තේමාත්මක සංක්ෂිප්ත

සංක්‍රමණය





# වෙනස්වන ශ්‍රම සංක්‍රමණය සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිචාර

තේමාත්මක සංක්ෂිප්ත පත්‍රිකා මාලාව
අංක 2 - 2015

cepa
centre for poverty analysis

# වෙනස්වන ශ්‍රම සංක්‍රමණය සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිචාර

ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණිකයන් හා සම්බන්ධව වෙනස් වන ජනවිකාසනය කෙරෙහි ප්‍රතිපත්තිමය ප්‍රතිචාර පිළිබඳ දළ විශ්ලේෂණයක්

**නාදියා නජාබ්**
**මොහොමඩ් මුනාස්**

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ ප්‍රකාශනයකි

තේමාත්මක සංක්ෂිප්ත පත්‍රිකා මාලාව

අංක 2 - 2015

©දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2015

**ISBN 978-955-1040-83-3**

තේමාත්මක සංක්ෂිප්ත යනු දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ සංක්ෂිප්ත පත්‍රිකා මාලවේ කොටසකි. එහි අරමුණ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය විසින් තොරතුරු නිර්මාණය කරනු ලබන විෂයයන්ට අදාළව කාලීනව හා ක්ෂණිකව තොරතුරු ඉදිරිපත් කිරීමයි.

සංක්ෂිප්ත පත්‍රිකා මාලාව ප්‍රවර්ග තුනකට අයත් ය.

1. **දරිද්‍රතා සංක්ෂිප්තඃ** නො නිල ස්වරූපයකින් හා තොරතුරු අන්තර්ගත වන ආකාරයෙන් රචනා කරනු ලබන මේවායේ අරමුණ වන්නේ විශේෂඥයන්ට මෙන් ම විශේෂඥ නො වන පාඨක පිරිසකට ද තොරතුරු සැපයීමයි.

2. **ප්‍රතිපත්ති සංක්ෂිප්තඃ** මෙම ප්‍රවර්ගය කෙළින් ම සංවර්ධනය හා දරිද්‍රතා අධ්‍යයනය හා සම්බන්ධ රජයේ, රාජ්‍ය නොවන, පර්යේෂක හා ආධාරක සංවිධාන ප්‍රතිපත්ති සම්පාදකයන් ඉලක්ක කර ගනියි.

3. **තේමාත්මක සංක්ෂිප්තඃ** විශේෂඥයන්ට මෙන් ම විශේෂඥ නොවන පාඨක පිරිසකට තොරතුරු සැපයීම අරමුණු කර ගත් මේවා විසින් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ තේමාත්මක කලාප පහේ ප්‍රශ්න ආවරණය කරයි. ඒවා තේමාත්මක කලාප පහට අයත් වන ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව හා අසමානතාව සමග ඍජුව සම්බන්ධ වන ප්‍රශ්න හදාරයි.

**නජාබ්, නාදියා**
වෙනස්වන ශ්‍රම සංක්‍රමණය සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිචාරඃ ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණිකයන් හා සම්බන්ධ වෙනස් වන ජනවිකසන කෙරෙහි ප්‍රතිපත්තිමය ප්‍රතිචාර පිළිබඳ දළ විශ්ලේෂණයක් / නාදියා නජාබ් සහ මොහොමඩ් මුනාස් - කොළඹ ඃ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2015

පි. 14 ඃ සෙමී. 21 - (තේමාත්මක සංක්ෂිප්ත ප්‍රකාශන මාලාව; අංක 02)

ISBN 978-955-1040-83-3

i. 331.544095493 ඩීවී 23 ii. ග්‍රන්ථ නාමය
iii. ග්‍රන්ථ මාලාව iv. මුනාස්, මොහොමඩ් සම කර්තෘ.

1. ශ්‍රම සංක්‍රමණ - ශ්‍රී ලංකාව

## පෙරවදන

මෙම තේමාත්මක සංක්ෂිප්තය ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විදේශගත වීමේ ඉතිහාසය ද, වෙනස්වන ශ්‍රම සංක්‍රමණ ප්‍රවණතා ද විමසා බලයි. ඊට අමතරව එය රටේ විදේශගත ශ්‍රම සම්පත් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක හා සැකසෙන නොයෙක් ප්‍රතිපත්ති පිළිබඳ පොදු විග්‍රහයක් මෙන් ම යෝජිත ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්ති නිසා අත්විය හැකි ප්‍රතිවිපාක ද ඉදිරිපත් කරයි.

මෙම සංක්ෂිප්තය සමාලෝචනයට ලක් කළ ආචාර්ය සේපාලි කෝට්ටෙගොඩ ට හා ගයත්‍රි ලොකුගේ ට ද, ප්‍රකාශනය සංස්කරණය කොට අවසන් පිටපත සූදානම් කළ රොෂ්නි අලස් ට ද කතුවරුන්ගේ ස්තුතිය හිමි වේ.

මෙම සංක්ෂිප්තය ලිවීම සඳහා අරමුදල් සැපයූ ආසියා පදනමට දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) සිය කෘතඥතාව පිරිනමයි. සිංහල හා දෙමළ පරිවර්තන සඳහා සහාය වූ සහ මෙම සංක්ෂිප්තය ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂාවලින් මුද්‍රණය කිරීමට අරමුදල් සැපයූ Think Tank Initiative (TTI) ආයතනයට ද දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය සිය කෘතඥතාව පළ කර සිටී.

මෙම සංක්ෂිප්තය තුළ ප්‍රකාශිත අදහස් හා මත කතුවරුන්ගේ වන අතර දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ අදහස් හා මත පිළිබිඹු නොකරයි.

**නාදියා නජාබ්** දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ කනිෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙකි. මොනෑෂ් විශ්වවිද්‍යාලයේ BBusCom/BComm උපාධිධාරිනියකි. දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ සන්නිවේදන හා ප්‍රතිපත්ති වැඩසටහනට සම්බන්ධව සිටින ඇය උනන්දුවන්නේ සංක්‍රමණය, සන්නිවේදනය හා ප්‍රතිපත්තිමය බලපෑම යන ක්ෂේත්‍රවල පර්යේෂණ කටයුතු පිළිබඳව ය.

**මොහමඩ් මුනාස්** දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙක් වන මොහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලද්දෙකි. සංක්‍රමණය නමැති තේමාත්මක ක්ෂේත්‍රය සම්බන්ධ විශිෂ්ටතම තේමාත්මක පර්යේෂකයා ඔහු ය. මුනාස්ගේ පර්යේෂණ පුහුණුව හා අත්දැකීම ක්ෂේත්‍ර කිහිපයක විහිදුනකිඃ එනම් දරිද්‍රතාව, ගැටුම්, ජීවනෝපාය, ධීවර කර්මාන්තය, සංක්‍රමණය හා ආර්ථික විද්‍යාවයි. දරිද්‍රතාව ආශ්‍රිත ගැටලු පිළිබඳ පර්යේෂණ පැවැත්වීමෙහිලා වසර අටකට වැඩි අත්දැකීම් ඔහු සතු ය. ශ්‍රී ලංකාවේ ගැටුමෙන් පීඩාවට පත් ප්‍රදේශයන්හි ඇගැයීම් වල යෙදීම සම්බන්ධයෙන් ද ඔහුට අත්දැකීම් ඇත.

# පටුන


1. හැඳින්වීම ..........1

2. ලංකාවේ බාහිර සංක්‍රමණයන්ගේ ඉතිහාසය ..........2

3. ශ්‍රම සංක්‍රමණයේ ලක්ෂණ හා ප්‍රවණතා ..........5

4. කාන්තා සංක්‍රමණය ..........11

4.1 සංක්‍රමණය වන්නේ ඇයි? ..........12

4.2 කාන්තාවන් ගෘහස්ථ කම්කරුවන් ලෙස සංක්‍රමණය වීම හා සම්බන්ධ ගැටලු ..........14

5. ප්‍රතිපත්තිමය බලපෑම් ..........17

6. නිගමනය ..........22

විමර්ශන ..........23

වැඩි දුර කියවීම් ..........27

# 1. හැඳින්වීම

මානව සමාජයේ මෑතකාලීන ඉතිහාසය තුළ ලෝකයේ විවිධ කලාපවල මිනිසුන් තාවකාලිකව මෙන් ම ස්ථිරව ද සංක්‍රමණයන්හි නියැලී ඇති ආකාරය දක්නට ලැබේ. ඒ සිය භෞතික හා සමාජ තත්ත්වයන් වැඩි දියුණු කර ගැනීමටයි. එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටු පිළිබඳ වේදිකාව [UNPAC] විසින් තක්සේරු කර තිබෙන ආකාරය අනුව ලෝකයේ සෑම මිනිසුන් හයදෙනෙකුගෙන් ම එක් අයෙක් සංක්‍රමණික කම්කරුවන් ලෙස ජාතික දේශ සීමා හරහා යති. එම සංඛ්‍යාව දළ වශයෙන් වසරකට බිලියනයක් වේ. ඔවුන්ගෙන් 72%ක් ම කාන්තාවෝ ය (UNPAC, 2011).

මිනිසුන් මෙසේ එක් ප්‍රදේශයක සිට තවත් ප්‍රදේශයකට සංක්‍රමණය වීම, එසේ සිදු වන්නේ කිසියම් ස්වාභාවික ව්‍යසනයක් නිසා නොවේ නම්, සාමාන්‍යයෙන් සිදු වන්නේ තමන් මුලින් සිටි රටෙහි ආර්ථික හා සමාජ අවස්ථා අප්‍රමාණවත් වීම හා තමන් යන රටෙහි ඒවා වඩා හොඳ යයි විශ්වාස කිරීම නිසා ය. 2009 වසරේ මානව සංවර්ධන වාර්තාව විසින් අවධාරණය කර තිබෙන පරිදි සංක්‍රමණය සඳහා ගනු ලබන පුද්ගල තීරණය හා සමාජ ආර්ථික සංදර්භය අතර ක්‍රියාශීලී අන්තර් ක්‍රියාකාරිත්වයක් තිබේ. මෙමගින් කියැවෙන කාරණය වන්නේ සංක්‍රමණය සඳහා අදාළ තීරණය ගැනීමේදී බලපාන්නේ එක් ඍජු කාරණයක් නො වන බවයි. එය සිදු වන්නේ කරුණු රැසක බලපෑම මත ය. දිළිඳුකම හා පවුල නඩත්තු කිරීමේ උවමනාව ගැහැනුන්ට මෙන් ම පිරිමින්ට ද සංක්‍රමණය සඳහා ප්‍රබල හේතුවකි. එහෙත්, කාන්තාවන් සංක්‍රමණය වීමට තීරණය කරන්නේ අනිවාර්යයෙන් ම දිළිඳුකම නිසා නො වේ. රාජ්‍ය හා ප්‍රජා පසුබිම්, සම්ප්‍රදායන් මෙන් ම පවුල් හා පුද්ගල තත්ත්වයන් ද ඊට වඩා එයට බලපායි (Caritas International, 2010). එසේ වුවත්, ලංකාවේ දශක තුනක යුද්ධය හා එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ දිළිඳුකම සංක්‍රමණය සඳහා හේතු වන කාරණයක් ලෙස නො තකා හැරිය නො හැකි ය. ඒ පිළිබඳව මෙම ලේඛනයේ යම් දුරකට සාකච්ඡා කෙරේ.

2009 දක්වා ම, ලංකාවේ ශ්‍රම කාරණා මත සංක්‍රමණය වූවන්ගෙන් බහුතරය කාන්තාවෝ වූහ. අදත් ඔවුහු සැලකිය යුතු ප්‍රතිශතයකි. ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ (SLBFE) 2011 වාර්තාව විසින් සපයන ලද දත්ත අනුව, ශ්‍රමය පිණිස පිටරටට සංක්‍රමණය වූ 127,090ක් කාන්තාවන් අතරින් 84.83%ක් ම මූලික වශයෙන් මැද පෙරදිගට ගෘහ කම්කරුවන්[1] ලෙස සංක්‍රමණය වී තිබේ. ඔවුන් යන රටවල් විසින් වීසා සම්පාදනයේ දී අදාළ කර ගනු ලබන කොන්දේසි හා සම්බන්ධ දුර්වල කම්කරු නීති හේතුවෙන් මෙම කාන්තාවෝ වැඩියෙන් ම අනතුරට භාජනය විය හැකි හා අඩුවෙන් ම ආදායම් ලබන පිරිස බවට පත් වෙති. පසුගිය කාලය පුරා ම ශ්‍රී ලංකාවේ

[1] 2011 වසරේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්තාවේ මෙම පිරිස හැඳින්වෙන්නේ ගෘහ සේවිකාවන් ලෙසයි.

විදේශගත ශ්‍රමිකයෝ කොන්ත්‍රාත් උල්ලංඝනය කිරීම්වලට, ශාරීරික හා ලිංගික හිංසනයන්ට සහ භාෂා හා සංස්කෘතික වෙනස්කම් නිසා සිදු වන වරදවා වටහා ගැනීම්වලට භාජනය වූ බවට වාර්තා ලැබී තිබේ. මෙවැනි සිද්ධි නිසා ශ්‍රී ලංකාවේ රජයට සංක්‍රමණික කම්කරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම පිණිස ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පියවර ගැනීමට සිදු විය.

ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණයේ සංදර්භය වඩා හොඳින් තේරුම් ගැනීම සඳහා මෙම තේමාත්මක සංක්ෂිප්තය පළමුව ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණයේ ඉතිහාසය, වෙනස් වන ශ්‍රම සංක්‍රමණ ප්‍රවණතා, සංක්‍රමණය වීමට ගත් තීරණය නිසා කාන්තාවන් නිවසේදී හා පිටරටදී මුහුණ දෙන විවිධ කරදර සහ පිටරටවල සිය ශ්‍රම බලකාය ආරක්ෂා කර ගැනීම පිණිස සම්පාදනය කර තිබෙන ප්‍රතිපත්ති පිළිබඳව අධ්‍යයනය කරයි. යෝජිත ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිවලින් ඇති විය හැකි ඇතැම් ප්‍රතිඵල ද අපි හඳුනා ගනිමු. සංක්‍රමණය සංකල්පයක් ලෙස ජාත්‍යන්තර සංක්‍රමණයන්ට පමණක් සීමා නො වන බව අපි හඳුනා ගනිමු. එහෙත්, මෙම සංක්ෂිප්තය වෙනුවෙන් අපි ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය හා ඒ හා සම්බන්ධ ප්‍රතිපත්ති කෙරෙහි අපගේ අවධානය යොමු කරන්නෙමු.

යෝජනාවේ සිට ප්‍රතිපෝෂණය හා සංශෝධන හරහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම දක්වා සැලකිය යුතු කාලයක් ගත වන හෙයින් එය අවසන් වශයෙන් සලකා බැලීමට පෙරාතුව, ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්ති වෙනස්කම්වල ඉතා මෑත කාලීන සංවර්ධනයන් හසු කර ගැනීම සඳහා තෝරා ගත් මාධ්‍ය වාර්තා කෙරෙහි මෙම තේමාත්මක සංක්ෂිප්තය විසින් අවධානය යොමු කරනු ලැබේ. එසේ කරන්නේ එමගින් යෝජිත ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්ති වෙනස්කම්වලට අදාළව වර්තමාන තත්ත්වය හා ඒ පිළිබඳ තිබෙන විවාදය ග්‍රහණය කර ගන්නට ලැබෙන බැවිනි. අනාගත ප්‍රතිපත්ති සැලසුම් හා ක්‍රියාත්මක කිරීම් වෙනුවෙන් මෙම තේමාත්මක සංක්ෂිප්තය ප්‍රයෝජනවත් වනු ඇතැයි බලාපොරොත්තු වේ.

## 2. ලංකාවේ බාහිර සංක්‍රමණයන්ගේ ඉතිහාසය

ශ්‍රමය වෙනුවෙන් රටින් බැහැරට සංක්‍රමණය වීම ශ්‍රී ලංකාවට නව ප්‍රවණතාවක් නො වේ. ජාතියක් ලෙස අපි මෙම සංක්‍රමණයේ විවිධ ස්වරූප බොහෝ කාලයක් තිස්සේ අත්දුටුවෙමු. මේ ආකාරයේ මුල් ම සංක්‍රමණයන් සිදු වූයේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ දී ය. එහි දී ශ්‍රී ලාංකික දෙමළ ජාතිකයෝ බ්‍රිතාන්‍ය ජාතිකයන්ට හිමි රබර් වතුවල වැඩ කිරීම සඳහා මැලේසියාවට සංක්‍රමණය වූහ (IPS, 2008).

මේ හා සම්බන්ධ සංඛ්‍යාලේඛන හා ප්‍රවණතා මීළඟ පරිච්ඡේදයේ දී සාකච්ඡා කරනු ලැබේ. පසුගිය වසර 20 ක පමණ කාලය තුළ මෑත වසරවල දී ශ්‍රී ලංකාවේ දළ සමස්ත සංක්‍රමණය මිලියන 1.5 හා 2 අතර පැවති බව සටහන් කළ යුතු ය.

ගෝලීය ප්‍රමිතීන් සමග සන්සන්දනාත්මකව බැලූ කල මෙය එතරම් විශාල සංඛ්‍යාවක් නො වන බව ශ්‍රී ස්කන්ධරාජා විසින් 2002 දී පෙන්වා දී තිබේ. එහෙත්, ලංකාවේ ජනගහණය හා සංක්‍රමණයේ චිරස්ථායී ස්වභාවය සමග ගත් කල එය කැපී පෙනේ. වත්මන් සංක්‍රමණික ප්‍රවණතා වඩා හොඳින් තේරුම් ගැනීම පිණිස මෑත කාලීන සංක්‍රමණික ප්‍රවාහයන් වැදගත් වේ.

තිස් වසරක් පුරා පැවති සිවිල් යුද්ධය සංක්‍රමණය ඉහළ නැංවීමට හේතු වූ මුත්, මහා පරිමාණ සංක්‍රමණයට පදනම වැටී තිබුණේ ඊට බොහෝ පෙර සිට ය. ශ්‍රී ලංකාවේ උගත් හා වෘත්තික ප්‍රභූන් අධ්‍යාපනය සඳහා ප්‍රධාන වශයෙන් ම බ්‍රිතාන්‍යයට සංක්‍රමණය වූහ (Sriskandarajah, 2002). එකල පැවති ලිහිල් ශ්‍රම හා අධ්‍යයන නීති හේතුවෙන් මෙම පිරිස පසුව එම රටවල රැකියා සොයාගෙන පදිංචි වූ හ.

1948 දී නිදහස ලැබීමෙන් පසු වෘත්තිකයන් විශාල පිරිසක් සංක්‍රමණය වීම හේතුවෙන් ශ්‍රී ලංකාව බුද්ධි ගලනය පිළිබඳ ප්‍රශ්නයකට මුහුණ දුන්නේ ය. මෙම සමයේ සංක්‍රමණය වූ වැඩි දෙනෙක් බර්ගර්[2] හා දෙමළ ජාතිකයෝ වූ හ. ඔවුන් සංක්‍රමණය වීමට ගත් තීරණයට එක් හේතුවක් වූයේ එසමයේ රජය විසින් සිංහල පමණක් එක ම ජාතික භාෂාව කිරීමට ගත් තීරණයයි (De Silva, 1981; Riberiro, 1999 in Bowatte, 2012). බර්ගර් සම්භවයක් ඇති ජනයා බොහෝ පිරිසක් ඕස්ට්‍රේලියාවට හා නවසීලන්තයට සංක්‍රමණය වූ හ. ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව 423,503ක් ජනයා එසේ සංක්‍රමණය වී තිබෙන මුත්, සංක්‍රමණයට හේතුව හරි හැටි නො දන්නා බව එහි ප්‍රකාශ වේ. (IPS, 2013: 1). මෙම බර්ගර් ජාතිකයන් එක්කෝ රැකියා සඳහා නැතිනම් ස්ථිර පදිංචිය සඳහා යන්නට ඇත. ඒ සමයේ වාර්තාවල මෙය පැහැදිලිව දැක්වෙන්නේ නැත. දෙමළ ජනයා එක්සත් රාජධානිය, ජර්මනිය, නෝර්වේ, ස්විට්සර්ලන්තය, ප්‍රංශය හා කැනඩාව වැනි යුරෝපා හා වෙනත් බටහිර රටවල් රැසකට සංක්‍රමණය වූ හ.

1970 අගභාගයේදී ලංකාවේ විරැකියා අනුපාතිකය 20%ක පමණ ඉහළ අගයක් ගත්තේ ය. තෙල් අපනයනයෙන් ඉහළ ආදායම් ලබන්නට පටන් ගත් මැදපෙරදිග තෙල් නිපදවන රටවල් විසින් මුහුණ දෙන ලද ශ්‍රම හිඟය හේතුවෙන් ඔවුන් සිය ශ්‍රම වෙළඳපොළ පිටරට ශ්‍රමිකයන්ට විවෘත කළේ මේ කාලයේ ය. එමගින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රමිකයන්ට හා වෙනත් නුපුහුණු කම්කරුවන්ට රැකියා අවස්ථා විවර විය. මෙම තත්ත්වය හා ශ්‍රී ලංකාවේ ඉහළ විරැකියා අනුපාතිකය හේතුවෙන් ශ්‍රී ලාංකිකයන්ට ගිවිසුම්ගත ශ්‍රම සංක්‍රමණයන් සඳහා අවස්ථාව ලැබිණි. ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මැදපෙරදිගට සංක්‍රමණය වන රැල්ල ආරම්භ වූයේ ඒ සමගයි. මුලින් මෙසේ සංක්‍රමණය වූවේ පිරිමි ය. රැකියා වියුක්තිය හා විදේශ විනිමය හිඟය පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් ලෙස එවකට පැවති රජය විසින් පිටරට රැකියා වෙනුවෙන්

---

[2] ලන්දේසි හා පෘතුගීසි සම්භවයක් ඇති අය

සංක්‍රමණය වීම දිරිගන්වන ලදි (Sriskandarajah" 2002). ''විදේශ රැකියා හා පිටරට සිට මුදල් එවීම දිරි ගැන්වීම සඳහා ගමන් බිමන් යාමේ හා මුදල් හුවමාරු කර ගැනීමේ නීති ලිහිල් කරන ලදී. රුපියල අවප්‍රමාණ වීමත් සමග විදේශ ඉපැයීම් දේශීය ඉපැයීම්වලට වඩා වටිනාකමින් ඉහළ ගියේ ය. මුලින් මැදපෙරදිග ශ්‍රම සංක්‍රමණ ප්‍රවාහය වේගවත් වුණේ මෙම හේතු විසිනි. එහෙත්, දැන් එය ශ්‍රී ලංකාවේ සංවර්ධනයට තීරණාත්මක වී තිබේ'' (එමඃ 289). 1979 දෙවන තෙල් මිළ ඉහළ යාමත් සමග මැදපෙරදිග කලාපයේ සිදු වූ ජීවන තත්ත්වයේ උසස්වීම හේතුවෙන් විදේශ ශ්‍රමිකයන් සඳහා ඉල්ලුම වැඩි විය. ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා රැකියා අවස්ථාව තවත් ඉහළ ගියේ ය.

1980 දශකයේ දී ජනවාර්ගික අර්බුදය උත්සන්න වීමත් සමග, ශ්‍රී ලාංකික දෙමළ ජාතික සරණාගතයන්, අක්‍රමවත් සංක්‍රමණිකයන්, ගිවිසුම්ගත සංක්‍රමණික කම්කරුවන් හා ස්ථිර පදිංචිකරුවන් ලෙස ඉන්දියාවට හා තවත් සමහර බටහිර රටවලට සංක්‍රමණය වීම වේගයෙන් ඉහළ ගියේ ය. 1987 - 89 සමයේ දිවයිනේ දකුණු ප්‍රදේශයේ දේශපාලන ප්‍රචණ්ඩත්වය හේතුවෙන් සිංහලයන් සරණාගතයන් ලෙස සංක්‍රමණය වීම ද සිදු වූ නමුත් එය ප්‍රමාණාත්මක ව අඩු ය (Karunaratne, 2008).

1990 දශකයේදී සංක්‍රමණ මට්ටමේ තවත් ඉහළ යාමක් සිදු විය. 1991 - 1999 කාල පරිච්ඡේදයේදී සියලු මිනිස් බල ප්‍රවර්ගවල සමස්ත සංක්‍රමණ සංඛ්‍යාවන් ඉහළ ගිය බව සංඛ්‍යා ලේඛන වලින් පෙනේ. ඒ අතරින් වැඩි ම වර්ධනය සිදු වූයේ නුපුහුණු ශ්‍රම ක්ෂේත්‍රයෙහි ය. 2007 දී රටින් බැහැර වීම්වල මුළු සංඛ්‍යාව 217,306ක් වූ අතර, එය 2006ට සාපේක්ෂව 7.6% වර්ධනයකි (CEPA, 2009 අනුව, De Silva and Perera, 2007 සහ Central Bank of Sri Lanka, 2007 ).

වර්තමානයේ දී විදේශ රැකියා වෙළඳපොළෙහි ඉහළින් ම තිබෙන්නේ මැදපෙරදිගයි. 90%කට වැඩි සංක්‍රමණයන් ප්‍රමාණයක් සිදු වන්නේ එම කලාපයටයි. කාන්තා ශ්‍රම සංක්‍රමණිකයන්ගෙන් 89%ක් ම සේවයේ යෙදෙන්නේ ගෘහස්ථ කම්කරුවන් ලෙසයි. මැද පෙරදිග රටවල් අතරින්, 2010 වසරේ සමස්ත පිටවීම්වලින් 80.6%ක් සිදු වූයේ සවුදි අරාබිය, කටාර්, කුවේට් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවලටය. (Central Bank of Sri Lanka, 2010). තෙල් අපනයනය කරන රටවල් හැර, මාලදිවයින, මැලේසියාව, සිංගප්පූරුව, හොං කොං, එක්සත් රාජධානිය, මුරුසිය, රුමේනියාව හා ඕස්ට්‍රේලියාව ද ශ්‍රී ලාංකිකයන්ගේ ජනප්‍රිය සංක්‍රමණික ගමනාන්ත වෙමින් තිබේ (Central Bank of Sri Lanka, 2010; Ruhunage, 2007).

ආගන්තුක රටවල තිබෙන ආරක්ෂණ ගැටලු නිසා ස්ත්‍රී ශ්‍රම සංක්‍රමණිකයන් අනතුරුවලට භාජනය විය හැකි තත්ත්වයක සිටීම හේතුවෙන් ශ්‍රී ලංකාව වැඩිපුර

පිරිමි ශ්‍රමිකයන් සංක්‍රමණය වීම දිරිගන්වමින් සිටියි. පිරිමි ශ්‍රම සංක්‍රමණිකයන්ට වැඩි ඉල්ලුමක් තිබෙන රටවල් වන්නේ දකුණු කොරියාව, මැලේසියාව, කටාර්, ඕමානය හා මාලදිවයිනයි. මැද පෙරදිග කටාර් වැනි රටවල් විසින් ඉල්ලා සිටින්නේ මැද මට්ටමේ වෘත්තිකයන් ඇතුළු මැද මට්ටමේ ශ්‍රමිකයන් ය (Ruhunage, 2007).


ජාතික ප්‍රශ්නය, ඉහළ යන ජීවන වියදම හා පිරිහෙමින් තිබෙන ජීවන තත්ත්වයන් යන කාරණා ශ්‍රී ලාංකිකයන් දියුණු හා ආරක්ෂිත ජීවන තත්ත්වයන් තිබෙන වෙනත් රටවලට හා කලාපයන්ට සංක්‍රමණය සඳහා පොළඹවන හේතු ලෙස හඳුනාගෙන තිබේ. අද වන විට ශ්‍රී ලාංකිකයෝ නිවාඩු, අධ්‍යාපනික අරමුණු, කෙටි හා දිගු කාලීන රැකියා හා ස්ථිර පදිංචිය වැනි හේතු රැසක් නිසා දිවයිනෙන් බැහැර යති.

## 3. ශ්‍රම සංක්‍රමණයේ ලක්ෂණ හා ප්‍රවණතා

අද වන විට ශ්‍රී ලංකාව යනු ඉහළ බාහිර සංක්‍රමණයක් ඇති රටක් ලෙස වාර්තා වේ. පහත සඳහන් සංඛ්‍යා ලේඛන විසින් පෙන්නුම් කරනු ලබන ආකාරයට ශ්‍රම සංක්‍රමණය පසුගිය දශක දෙක පුරා කෙතරම් ඉහළ ගොස් තිබේ ද යත්, ශ්‍රී ලංකාව ශුද්ධ ශ්‍රම අපනයනකරුවකු ලෙස සැලකේ. *Trading Economics*[3] අනුව, ශ්‍රී ලංකාවේ ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය සෘණ 1.95 කි. ඒ අනුව පෙනී යන කරුණක් වන්නේ සෑම වසරකම රටට ඇතුළු වන ප්‍රමාණයට වඩා රටින් පිට වන ප්‍රමාණය වැඩි බවයි (*Trading Economics,* 2013). එහෙත්, රටින් පිට වන සියලු මිනිසුන් ශ්‍රම අවශ්‍යතා වෙනුවෙන් පමණක් ම එසේ නො කරන නිසා මෙම අගය පිරිසිදු කර ගත යුතු ව තිබේ. ශ්‍රමය සඳහා සංක්‍රමණය කරනවා මෙන් ම, ශ්‍රී ලාංකිකයෝ විශාල පිරිසක් අධ්‍යාපනික, නිවාඩු හා ස්ථිර පදිංචිය වෙනුවෙන් ද සංක්‍රමණය වන බව අප හඳුනා ගත යුතු ය. ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න හේතුවෙන් හා දේශපාලන රැකවරණ පතමින් විදේශගත වන්නන් අඩංගු නො වන නිසා මෙම සංක්‍රමණික දත්තවල අඩුපාඩු තිබිය හැකි ය. මෙම සංක්ෂිප්ත වාර්තාව විසින් අවධානය යොමු කරනු ලබන්නේ කෙටි කාලීන ශ්‍රම අරමුණු වෙනුවෙන් පිටරට යන අය කෙරෙහි පමණි. එපමණින්, වෙනත් කණ්ඩායම්වල පැවැත්ම නො සලකා හැරිය නො හැකි ය. ඒවා ගණන් ගත යුතු ව තිබේ.

[3] *Trading Economics* නිල මූලාශ්‍ර මත පදනම්ව රටවල් 232 ක් පිළිබඳ තොරතුරු සපයන බිහිදෙරකි.

1 රූප සටහන : සමස්ත සංක්‍රමණ ප්‍රවණතා




මූලාශ්‍රය: *විදේශ රැකියා පිළිබඳ වාර්ෂික වාර්තාව 2009, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*


විදේශ රැකියා පිළිබඳ වාර්ෂික සංඛ්‍යාන වාර්තාව (2009) අනුව, පිටරට වෙසෙන ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් ප්‍රමාණය මිලියන 1.7 කි. එහෙත් මෙම සංඛ්‍යා සම්පූර්ණයෙන් ම නිවැරදි නැත. මන්ද, සියලු සංක්‍රමණිකයන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වන්නේ නැත. එසේ ම, ලියාපදිංචි නැති නියෝජිතායතන හරහා සහ අවිධිමත් මාර්ගවලින් සංක්‍රමණය වන අය මෙයට අයත් වන්නේ නැත. එබැවින් සත්‍ය සංඛ්‍යා මීට වඩා වැඩි විය යුතු ය. තත්ත්වය මෙසේ වෙද්දී පවා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය කාලයක් තිස්සේ එක්රැස් කළ වාර්තා අනුව පසුගිය දශක දෙකක කාලය තුළ ශ්‍රම සංක්‍රමණිකයන්ගේ සංඛ්‍යාව 330%[4] කින් වැඩි වී තිබේ.

ශ්‍රම සංක්‍රමණය ආරම්භ වී මුල් සමයේ (එනම් 1970 දශකයේ අග භාගයේදී හා 1980 දශකයේ මුල භාගයේදී) වැඩිපුර සංක්‍රමණය වුණේ ඉදිකිරීම් කම්කරුවන් වැනි පිරිමි පුහුණු ශ්‍රමිකයෝ ය. මැද පෙරදිග තෙල් සල්ලිවල වර්ධනය නිසා ඇති වූ ඉල්ලුම එයට හේතු විය. එහෙත්, 1980 දශකය අග භාගය වන විට වැඩිපුර සංක්‍රමණය

[4] [(262960-60168)/(60168)] *100 = 337.0429%
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2011 වාර්ෂික වාර්තාවේ දත්ත භාවිතා කරමින් කතුවරයා විසින් ගණනය කරන ලදී. සැලකිල්ලට ගන්නා ලද කාල පරිච්ඡේදය 1994 - 2011

වූවෝ කාන්තාවෝ ය. පිටත්වීම්වලින් තුනෙන් දෙකක් පමණ කාන්තාවන් වූ අතර එම රටවල ගෘහස්ථ ශ්‍රමිකයන් සඳහා වැඩි වූ ඉල්ලුම මෙම තත්ත්වයට හේතු විය. (Gunatilleke, 1991 in Sriskandarajah, 2002, p 293). මෙසේ සංක්‍රමණය වන කාන්තාවන්ගෙන් බොහෝ දෙනෙක් නුපුහුණු ගෘහස්ථ කම්කරුවන් ලෙස සේවය කළත්, ඔවුන්ගෙන් 3/4 ක් පමණ ද්විතීයක අධ්‍යාපනය ලද අය ය. ඉතිරි 1/4 ද ප්‍රාථමික අධ්‍යාපනය ලද අය යි (එම). සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතින මෙම අධ්‍යාපන මට්ටමට හේතුව නිදහස් අධ්‍යාපනය වන අතර ශ්‍රී ලාංකික ගෘහස්ථ ශ්‍රමිකයන්ට ඉල්ලුම වැඩි වෙන්නට හේතුව ද එයයි.

**2 රූප සටහන : පිරිමි හා කාන්තා ශ්‍රමිකයන්ගේ සන්සන්දනය (1996-2011)**




මූලාශ්‍රය: *විදේශ රැකියා පිළිබඳ වාර්ෂික වාර්තාව 2011, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*


දැනට තිබෙන සංඛ්‍යාලේඛනවලින් කියැවෙන්නේ විදේශ රැකියා නියුක්තියේ කාන්තා සහභාගිත්වය මුලින් ම පිරිමින් ඉක්මවා ගියේ 1988 දී බවයි. මෙම ප්‍රවණතාව 2007 දක්වා ම පැවති අතර එම වසරේදී පළමු වරට වසර විස්සකට පසුව පිරිමි සංක්‍රමණිකයන් සංඛ්‍යාව කාන්තාවන් ඉක්මවා ගියේ ය (SLBFE, 2011, *Annual Statistical Report of Foreign Employment 2011*). පිරිමි ශ්‍රමිකයන් සංඛ්‍යාව කාන්තා ශ්‍රමිකයන් සංඛ්‍යාව ඉක්මවා ගිය ද ඉහත රූපයෙන් පෙන්නුම් කෙරෙන ආකාරයට කාන්තා හා පිරිමි සංක්‍රමණික ශ්‍රමිකයන් සංඛ්‍යාව අතර පරතරය අතීතයේදී තරම් සැලකිය යුතු අන්දමින් පුළුල් නැත. ඉහත රූපයෙන් නිරීක්ෂණය කළ හැකි තවත් කාරණයක් වන්නේ, 2005 දී කාන්තා ශ්‍රම සංක්‍රමණිකයන්ගේ වර්ධනයේ අඩුවක්

ඇති බවයි. ඒ හා සමපාතව පිරිමි සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාවේ සාපේක්ෂ වශයෙන් ඉහළ වර්ධනයක් තිබේ. කාන්තා විදේශ ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාවන් වර්ධනය නො වීමට හේතු ලෙස සැලකෙන්නේ ශ්‍රී ලංකාවේ වැඩිපුර රැකියා තිබීම හා වයස අවුරුදු 5 ට අඩු දරුවන් සිටින මව්වරුන් සංක්‍රමණය වීම අධෛර්ය කිරීම සඳහා රජය විසින් ගන්නා ලද පියවරයි. (IPS, 2013 අනුව IOM 2008). පුහුණු පිරිමි සංක්‍රමණිකයන් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ද රජයේ මැදිහත් වීමක් තිබේ. එයට හේතුව කාන්තා නුපුහුණු ශ්‍රම ක්ෂේත්‍රයේ නියාමනයක් නො පැවතීම හා එමගින් කාන්තාවන් විදේශයන්හිදී සූරාකෑමට ලක් වීමේ අනතුර වැඩි වීමත්, ගෘහස්ථ ශ්‍රමය සඳහා ගෙවීම් ද පිරිමින්ට සාපේක්ෂව අඩු වීමත් ය.

පුහුණු ශ්‍රමිකයන්ගේ සංක්‍රමණය වැඩි කිරීම සඳහා රජය විසින් ගන්නා ලද පියවර ඵලදායී වී තිබෙන බව පහත රූපයෙන් පෙනේ. විශේෂයෙන් ම, ඉහළ කුසලතා අවශ්‍ය ප්‍රවර්ගවල සංක්‍රමණය පසුගිය වසර කීපය තුළ ඉහළ ගොස් තිබේ. එහෙත්, ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙන් කර තිබෙන පහත රූපයේ දැක්වෙන ආකාරයට (පුහුණු සංක්‍රමණිකයෝ, 1994-2011) පුහුණු ශ්‍රමිකයන්ගේ සංක්‍රමණය වැඩිපුර ම සිදු වන්නේ පිරිමින් හා අදාළව ය. පිරිමි පුහුණු ශ්‍රමිකයන් සංක්‍රමණය වීම දිරි ගැන්වීම සඳහා ගන්නා ලද පියවර කිසියම් දුරකට සාර්ථක වී ඇති බව පෙනේ.

3 රූප සටහන : ශ්‍රම සංක්‍රමණයේ කුසලතා මට්ටම


(සංක්‍රමණිකයන් සංඛ්‍යාව, වසර, වෘත්තික මට්ටම, මැද මට්ටම, ලිපිකරු හා වෙනත් එවැනි ශ්‍රේණි, පුහුණු)




මූලාශ්‍රය: *විදේශ රැකියා පිළිබඳ වාර්ෂික වාර්තාව 2011. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

**4 රූප සටහන : පුහුණු සංක්‍රමණිකයෝ - (1994 - 2011)**

(සංක්‍රමණික සංඛ්‍යාව, වසර, කාන්තා සංක්‍රමණිකයෝ, පිරිමි සංක්‍රමණිකයෝ)





මූලාශ්‍රය: *විදේශ රැකියා පිළිබඳ වාර්ෂික වාර්තාව 2011. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

ඉහත රූපයෙන් පෙන්නුම් කෙරෙන ආකාරයට, වෘත්තික, මැද මට්ටමේ, ලිපිකාර හා අදාළ ශ්‍රේණි ප්‍රවර්ගවල ශ්‍රම සංක්‍රමණිකයන්ගේ සංඛ්‍යාවන් ඉහළ යාමේ ප්‍රවණතාවක් තිබේ. ඉහළ කුසලතා අවශ්‍ය ශ්‍රමිකයන්ගේ සංක්‍රමණයන් දිරි ගැන්වීම සඳහා කර තිබෙන මැදිහත්වීම් ඵලදායී වී තිබෙන බව මෙමගින් පෙන්නුම් කෙරේ. සාමාන්‍යයෙන් ඉහළ කුසලතා අවශ්‍ය රැකියාවන්ට ඉහළ වැටුප් ද ගෙවනු ලැබේ. ඒවායේ ශ්‍රම තත්ත්වයන් ද ඉහළ ය. මෙම ප්‍රවණතාව දිගට ම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ඉහළ කුසලතා අවශ්‍ය රැකියා සඳහා සංක්‍රමණය වීම වැඩි වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළත්, 2011 වන විටත්, ඉහළ ම පුහුණු ශ්‍රමික ප්‍රවර්ග වන වෘත්තික, මැද මට්ටමේ හා ලිපිකාර හා වෙනත් එවැනි ශ්‍රේණිවල සංක්‍රමණය සමස්තයක් ලෙස ම නියෝජනය කරන්නේ මුළු සංක්‍රමණයන්ගෙන් 7% ක් පමණි. ඒ හා සන්සන්දනාත්මකව විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගෘහ සේවිකාවන් ලෙස වර්ග කර තිබෙන ශ්‍රමිකයෝ මුළු සංක්‍රමණිකයන්ගෙන් 41%ක් ම නියෝජනය කරති. ඒ වනාහි වැඩි ම ශ්‍රම සංක්‍රමණිකයන් ප්‍රවර්ගයයි. මේ අනුව, නුපුහුණු ශ්‍රමිකයෝ සමස්ත ශ්‍රම සංක්‍රමණිකයන්ගෙන් 65%ක් වන පැහැදිලි බහුතරයක් වෙති.

5 රූප සටහන : මිනිස්බල කණ්ඩායම අනුව විදේශ රැකියා නියුක්තිය සඳහා පිටත් වීම - 2011

වෘත්තික මට්ටම, මැද මට්ටම, ලිපිකරු හා වෙනත් එවැනි ශ්‍රේණි, පුහුණු, අර්ධ පුහුණු, නුපුහුණු, ගෘහ සේවිකා)




*මූලාශ්‍රයː: විදේශ රැකියා පිළිබඳ වාර්ෂික වාර්තාව 2011, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*

වැසියන් විදේශ රැකියා වෙනුවෙන් සංක්‍රමණය වීම මුළුමනින් ම අධෛර්යය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයෝ කැමැත්තක් නො දක්වති. එයට හේතුව විදේශ රැකියා හේතුවෙන් රටේ විරැකියා අනුපාතිකය පහළ මට්ටමක පැවතීමයි. (Central Bank of Sri Lanka, 2011/2012). විරැකියා අනුපාතිකය අඩු වීමට එකම හේතුව ශ්‍රම සංක්‍රමණය නොවේ. ශ්‍රම බලකායෙන් 17%ක් සංක්‍රමණය කර තිබීම හේතුවෙන් එය අතීතයේ මෙන් ම අදත් යම් දායකත්වයක් කරනවා විය හැකි ය. එහෙත්, 1996 සිට රටේ විරැකියා අනුපාතිකය පහත වැටෙමින් තිබේ. 2012 දී එය ඉතිහාසයේ පහත් ම අගය වන 4% දක්වා පහත වැටිණි (එම). එසේ ම, විදේශ රැකියාවලින් ලැබෙන ආදායම ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය උත්පාදන මාර්ගවලින් එකකි. එක්සත් ජනපද ඩොලර් බිලියන 6ක් වන එය ශ්‍රී ලංකාව ඇඟලුම් සහ වෙනත් භාණ්ඩ හා සේවා අපනයනයෙන් ලබන ආදායමට වඩා වැඩි ය. එබැවින් එය ජාතික ගෙවුම් ශේෂයට යහපත් දායකත්වයක් කරයි. ශුද්ධ විදේශ ආදයම අනුව රටට ඉහළම ආදයමක් උපයා දෙන අංශය මෙයයි.

ශ්‍රම සංක්‍රමණිකයන්ගේ සුබසාධනය පිළිබඳ ගැටලු රැසක් තිබේ. විශේෂයෙන් ම මැදපෙරදිග රටවල ශ්‍රමිකයන්ට මෙම තත්ත්වයට මුහුණ දෙන්නට සිදු වී තිබේ. ගෘහ සේවිකාවන් ලෙස සංක්‍රමණය වන කාන්තාවන්ට දෙගුණයක් ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වී තිබේ. මෙම ගෘහ සේවිකාවන්ට සිදු වන ශාරීරික හා මානසික පීඩා, ලිංගික අතවර වැනි නො මනා සැලකීම්, වැටුප් නො ගෙවීම හෝ අදාළ ගිවිසුමට අදාළ නො වන වැඩට යෙදවීම වැනි කොන්ත්‍රාත් උල්ලංඝනය කිරීමේ අවස්ථා පිළිබඳ නිරතුරුව ම වාර්තා වේ. මෙවැනි වාර්තා නිරතුරුව ම පළ වුණත් පහළ මට්ටමේ කුසලතා අවශ්‍ය රැකියා සඳහා මිනිසුන් සංක්‍රමණය වීම පසුගිය කාලය මුළුල්ලේ ම අඩු වී නැත. තවමත් සංක්‍රමණිකයන්ගෙන් වැඩි ප්‍රතිශතයක් වන්නෝ ඔවුහු ය. (ප්‍රතිපත්ති සම්පාදකයෝ මෙම තත්ත්වය වෙනස් කිරීමට උත්සාහ කරමින් සිටිති.)

මීළඟ පරිච්ඡේදය කාන්තා සංක්‍රමණය පිළිබඳව සවිස්තරාත්මකව සලකා බලයි. වෙනස් වන ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිවලින් ඇති විය හැකි ඇඟවීම් පිළිබඳව ද සොයා බලමු. 2009 වසරේ මානව සංවර්ධන වාර්තාවේ (UNDP, p 3) දැක්වෙන පරිදි 'සංක්‍රමණය යනු, දිළිඳුකම අවම කිරීමේ හා මානව සංවර්ධනය වැඩිදියුණු කිරීමේ පුළුල් ප්‍රාදේශීය හා ජාතික ප්‍රයත්නයන්ට උපකාරී වන දෙයකි.' ඒ අනුව, ශ්‍රම සංක්‍රමණය හා සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනයේදී අඩු කුසලතා ඇති ශ්‍රමිකයන් රැකියා සඳහා විදේශගත වීම අධෛර්යය කරන්නට පියවර ගන්නේ නම් ඔවුන්ට ජීවනෝපාය විකල්ප සැපයීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය.

## 4. කාන්තා සංක්‍රමණය

සංක්‍රමණික හැසිරීමට අදාළව කාන්තාවන් හා පිරිමින් අතර වෙනස්කම් තිබේ. ඔවුන්ට තිබෙන අවස්ථා එකිනෙකට වෙනස් ය. ඔවුන්ට මුහුණ දෙන්නට සිදු වන මානව හිමිකම් උල්ලංඝන, සූරාකෑම, වෙනස් අන්දමින් සැලකීම හා සෞඛ්‍යමය අනතුරු වැනි අභියෝග හා අනතුරු ද වෙනස් ය (Caritas, 2012). එසේම, රැකියාවක් සඳහා විදේශගත වීමට කාන්තාවක් ගන්නා තීරණය හේතු කොටගෙන ඇති වන ප්‍රතිඵල ද සැලකිල්ලට ගත යුතු ය. කාන්තාව වාණිජමය නො වන ආකාරවලින් නිවසේ ආර්ථිකයට සුවිසල් දායකත්වයක් කරන බැවින් ඇය නිවසින් පිට වීමත් සමග ඇති වන්නේ හිඩැසකි. ශ්‍රම සංක්‍රමණිකයන්ගෙන් කැපී පෙනෙන අනුපාතිකයක් කාන්තාවන් වූ නිසා හා තවමත් එම තත්ත්වය එසේ ම නිසා ගෘහ සේවිකාවන් ලෙස කාන්තාවන් සංක්‍රමණය වීම ගැන අවධානය යොමු කිරීම වැදගත් ය. 2011 දී සමස්තයක් ලෙස සංක්‍රමණය වූ ශ්‍රමිකයන්ගෙන් 48%ක් කාන්තාවන් වූ අතර 88%ක්ම ගෘහ සේවිකාවෝ වූ හ (SLBFE, 2012).

ශ්‍රී ලංකාවේ සිට කාන්තාවන් ගෘහ සේවිකාවන් ලෙස පිටරට ට සංක්‍රමණය වීම ආරම්භ වුණේ 1970 දශකයේ දී මැදපෙරදිග තෙල් වෙළෙඳපොළ බලවත් වීමෙන්

පසු ලෙබනනය බලා ගිය වනිතාවන්ගෙනි. එතැන් පටන් ලාංකික කාන්තාවෝ සිය විස්තෘත හා න්‍යෂ්ටික පවුල්වලට උපකාර කිරීමේ අරමුණින් යුතුව ගෘහ සේවිකාවන් හා දරුවන් බලා ගන්නා කාන්තාවන් ලෙස මැදපෙරදිගට හා ලෙබනනයට සංක්‍රමණය වෙමින් සිටිති. (Smith, 2010 අනුව Junreidini, 2006). මෙම කාන්තාවන් උපයන ආදායම් ඔවුන්ට පෞද්ගලිකව වැදගත් වන අතර විදේශ විනිමය උත්පාදන මාර්ගයක් ලෙස ආර්ථිකයට ද වැදගත් ය.

ගැම්බර්ඩ් (2009:62) විසින් ප්‍රකාශ කරන ලද පරිදි 2005 දි ලංකාවේ සමස්ත විදේශ රැකියා ආදායම ඩොලර් බිලියන 1.9ට වැඩි අගයක් ගනිද්දී එයින් අඩකටත් වඩා උපයන ලද්දේ මැද පෙරදිගිනි. 2012 වන විට ලංකාවේ සමස්ත විදේශ රැකියා ආදායම ඩොලර් බිලියන 5.985 ක් විය. (US$ 5.988B) (Central Bank of Sri Lanka, 2012)[5]. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල අනුව (IPS Migrant Profile, 2006, p 17), කාන්තාවන් විසින් උපයනු ලබන මුදල් බොහෝ විට ආහාර, ඇඳුම් හා ළමයින්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම් හා ජීවන තත්ත්වය නැංවීමේ සාමාන්‍ය ක්‍රියාමාර්ග වෙනුවෙන් වෙන් වේ. විදේශ රැකියාවන්ගෙන් උපයන මුදලින් සාමාන්‍යයෙන් එක් කාන්තාවක් පවුල් සාමාජිකයන් පස්දෙනෙකුට උපකාර කරන බව තක්සේරු කර තිබේ. එබැවින් ගෘහ සේවිකා රැකියාවල යෙදෙන කාන්තා සංක්‍රමණික ශ්‍රමිකයන් ආර්ථික දායකත්වයක් සපයනවා පමණක් නො වේ. ඔවුහු අධ්‍යාපනය හා සෞඛ්‍යය වැඩිදියුණු කිරීමෙන් සමස්තයක් ලෙස ම පවුලේ යහපතට දායක වෙති.

## 4.1 සංක්‍රමණය වන්නේ ඇයි?

සංක්‍රමණය කිරීමට ගන්නා තීරණය තනි තේරීමක් වන්නේ කලාතුරකිනි. එය බොහෝ විට, පවුලේ උන්නතිය වෙනුවෙන් ගනු ලබන සාමූහික, සමාජ තීරණයකි. එයට හේතු වන කාරණා අතර අයහපත් ආර්ථික තත්ත්වය තුළ පවුල වෙනුවෙන් ආදායමක් ඉපැයීමේ අවශ්‍යතාව, අධ්‍යාපන අවස්ථා හිඟ වීම හා සාපේක්ෂ වශයෙන් කාන්තාවන්ගේ වැටුප් පහළ මට්ටමක පැවතීම ප්‍රමුඛ වේ. එසේම, සමාජ නිදහස අවම වීම, පීඩාකාරී විවාහයකින් පලා යෑම, ගෘහස්ථ හිංසනය හා සම අවස්ථා සඳහා ඇති උවමනාව යන කරුණු මේ සඳහා දායක වන ආර්ථික නොවන කාරණා වේ (Caritas International, 2010). රැකියා සඳහා යන රටවලින් ඒ සඳහා ආකර්ශනයක් ඇති කිරීමට හේතු වන කාරණා වන්නේ, ආකර්ශනීය වැටුප් අනුපාතික, ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීම පිළිබඳ අපේක්ෂා, නිදහස හා ඒ රටවල ගෘහස්ථ කම්කරුවන් සඳහා ඉල්ලුම වැඩි වීමයි. මේ කාරණා හැම විටම විදේශ රැකියා සඳහා පිටත් වීම කෙරෙහි බලපාන්නේ නැත. මන්ද, තමන් යන රටේ ශ්‍රම තත්ත්වය, සමාජ ආර්ථික වටපිටාව ආදිය පිළිබඳ ව ඔවුන්ට දැන

[5] එක්සත් ජනපද ඩොලර් බිලියන හයක් යනු ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 8.2%කි. රටේ සමස්ත විදේශ විනිමය ආදායම්වලින් 35%කි. (The Island ( <http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=81164>

ගන්නට ලැබෙන්නේ ගිය පසුව බැවිනි. පසුගිය වසර 5 - 10 අතරතුර කාලයේදී ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය මෙම අඩුපාඩු මග හරවා ගැනීම පිණිස සිය පුහුණු වැඩසටහන් සකස් කළේ ය. එහෙත්, ඒ පුහුණුව සංක්‍රමණිකයන්ගේ අවශ්‍යතාවන්ට සෑහේ ද යන්න අභියෝගයට ලක් කළ හැකි ය. ඔවුන් තමන් කරන්නට යන රැකියාව ගැන අවබෝධයක් ලබා ගන්නේ කලින් සංක්‍රමණය වූ පුද්ගලයන් හා වංචනික රැකියා නියෝජිතායතන ආදිය හරහා ය. මෙම තොරතුරු යම් ප්‍රමාණයකට විකෘති වී තිබේ. මන්ද, ඒවා පසුබිමේ ලජ්ජාවට පත් වන්නට සිදු වන කරුණු සැඟවීමේ හා පිටරට යෑම දිරිගැන්වීමේ අරමුණු තිබෙන බැවිනි.

විදේශ රැකියා සඳහා පිටත් වන බොහෝ දෙනෙකුට කිසිදු දේපළක් නැති බැවින්, රැකියා නියෝජිතානයතන වලට හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ගෙවීම පිණිස ණය ගැනීමට, දේපළ හා රන් ආභරණ උගස් තැබීමට හෝ විකිණීමට ඔවුන්ට සිදු වේ. අමාරුවෙන් සපයා ගන්නා මේ ධනය නාස්ති කළ නො හැකි බැවින් පහසු ම විසඳුම සොයනු ලැබේ. කාන්තාවන්ට සංක්‍රමණය වීමේ දී දරන්නට සිදු වන වියදම අඩු නම්, කාන්තාවෝ සංක්‍රමණය වෙති. අතීතයේ දී පිරිමින්ට සංක්‍රමණය වීම සඳහා වැඩි පිරිවැයක් දරන්නට සිදු වීම ද කාන්තාවන් සංක්‍රමණය වීම වැඩි වීමට හේතු විය. සංක්‍රමණය කිරීමට පෙර මාස තුනක වැටුප් ගෙවන අවස්ථා තිබේ. එය කාන්තාවන් සංක්‍රමණය සඳහා පෙළඹවීමට හේතු වෙයි. මන්ද, එය පවුලේ ආර්ථික අපහසුම්වලට ක්ෂණික විසඳුමකි. සංක්‍රමණය සඳහා අවශ්‍ය මූලික වියදම් අධික වීම හේතුවෙන් දැඩි ආර්ථික අපහසුතා ඇති අයට ජාත්‍යන්තර සංක්‍රමණය අපහසු වන බවට ඇති න්‍යාය මෙමගින් බොරු බවට පත් කරනු ලැබේ (De Haan, A & Yqub, S. 2009). මෙම සංදර්භය තුළ, උග්‍ර දිළිඳුභාවයට මුහුණ දෙන කාන්තාවෝ ශ්‍රම සංක්‍රමණය ආකර්ශනීය විකල්පයක් ලෙස සලකති.

ශ්‍රී ලංකාවේ නුපුහුණු හා අර්ධ පුහුණු කාන්තාවන්ට සිය ශ්‍රමය භාවිත කිරීම සඳහා අවස්ථා අඩු ය. ගෘහස්ථ කටයුතු සැලකෙන්නේ අඩු කුසලතා ඇති, සමාජ ආර්ථික හා අධ්‍යාපනික තතත්වයන් හේතුවෙන් වෙනත් අවස්ථා නැති, වැටුප් රැකියා සොයන කාන්තාවන්ට තිබෙන එක ම විසඳුම ලෙසයි (Amnesty International, 2007). අඩු කුසලතා ඇති, හැකියාවක් තිබෙන අය වැවිලි අංශයේ හා ඇඟලුම් කර්මාන්තශාලාවල අඩු වැටුප් මත සේවයට එක් වෙති (Wickremesinghe & Jayatilaka, 2006). කිසියම් නිශ්චිත අංශයක වැඩ කිරීමට සිදු වීමෙන් ඔවුන්ට ප්‍රමාණවත් ආදායමක් ඉපැයීමේ අවස්ථාව ගිලිහී යයි. දේශීය ශ්‍රම වෙළඳපොළට වඩා ආදායමක් ඉපැයීමේ අවස්ථාව ලැබෙන බැවින් ද, අවශ්‍ය වන්නේ අවම කුසලතා ප්‍රමාණයක් බැවින් ද, ඉල්ලා සිටින කුසලතා සුවිශේෂ ඒවා නො වන හෙයින් ද කාන්තාවෝ ගෘහ සේවිකාවන් ලෙස සංක්‍රමණය වීමට කැමැත්තක් දක්වති.

## 4.2 කාන්තාවන් ගෘහස්ථ කම්කරුවන් ලෙස සංක්‍රමණය වීම හා සම්බන්ධ ගැටලු

තමන්ගේ රටේ රැකියා වියුක්තිය පිළිබඳ ගැටලුවට විසඳුමක් ලැබෙන හෙයින් ද, ආර්ථිකයට හා සංවර්ධනයට සෘජුව ම වැදගත් වන විදේශ විනිමය සපයා දෙන හෙයින් ද රටවල් විදේශ රැකියා දිරිගන්වති (Jureidini, 2002). ඇතැම් සංක්‍රමණිකයන් ගෘහස්ථ අංශයේ විදේශ රැකියා හේතුවෙන් වාසි ලබා ඇති මුත්, බොහෝ රටවල මානව හිමිකම්, ශ්‍රම සූරාකෑම, ප්‍රචණ්ඩත්වය, බලහත්කාරයෙන් රැගෙන යාම හා මරා දැමීම වැනි කාරණා නිසා දැවැන්ත ආරක්ෂණ පරතරයක් නිර්මාණය වී තිබේ [6] (Human Rights Watch, 2010a). මේ හේතුවෙන් විදේශ රැකියාවලින් ලැබෙන ආර්ථික ප්‍රතිඵලය එහි සමාජමය පිරිවැය සමඟ සන්සන්දනාත්මකව බැලූ කල ප්‍රශ්නකාරී ය. මෙම කාන්තාවන් තම මව් රට හැර යන්නේ තමන්ටත් තමන්ගෙන් යැපෙන්නන්ටත් වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබා දීම සඳහා ය. එහෙත් විවිධ වාර්තාවලින් පෙන්වා දී තිබෙන ආකාරයට බොහෝ කාන්තාවන් කබලෙන් ළිපට වැටී තිබේ. බොහෝ ගෘහ සේවිකාවෝ මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ලක් වෙති. ඒ ඔවුන්ගේ අධ්‍යාපනයට, සෞඛ්‍යයට, ප්‍රමාණවත් ජීවන තත්ත්වයකට හා නිදහසේ එහෙ මෙහෙ යාමට ඇති අයිතීන් උල්ලංඝනය වීමෙනි (Amnesty International, 2007). කාන්තාවනට ලැබෙන රැකියා අස්ථාවර ය. වැටුප් අඩු ය. සමාජ සේවාවන්ට පිවිසීම වළක්වා තිබේ. ඔවුහු දැඩි ලෙස අනතුරට ලක් වෙති. ඔවුන්ගේ රැකියා තත්ත්වය දුර්වල ය. මෙම තත්ත්වය හමුවේ ඔවුහු අසාධාරණයට, දූෂණයට, හොර ජාවාරම්වලට හා ගණිකා වෘත්තියට ද ගොදුරු වෙති (Caritas International, 2010).

මෙම කාන්තාවන් දුබල තත්ත්වයට පත් කරන තවත් සුවිශේෂ සාධකයක් වන්නේ ඔවුන් රැකියා සඳහා පිටත් වන රටේ දී ඔවුන්ට ලැබෙන ජීවන තත්ත්වයයි. බොහෝ ගෘහ සේවිකාවන් ඔවුන්ගේ ගිවිසුම ප්‍රකාරව ම ස්වාමියාගේ නිවසේ රැඳී සිටින අතර ඔවුහු රැකියාව වෙනුවෙන් පමණක් නොව නවාතැන් වෙනුවෙන් ද ස්වාමියා මත රඳා පවතිති. ගැම්බර්ඩ් (2009: 65) විසින් කරන ලද සමීක්ෂණයකින් දක්වා තිබෙන පරිදි, නිවසේ ම රැඳී සිටින කාන්තාවන් වේලාව අවේලාව නො බලා ඕනෑම වේලාවක සේවයට කැඳවීමේ හැකියාව ස්වාමීන්ට තිබෙන බැවින් ඔවුන්ට 'වැඩ කාලය' හා 'වැඩ ස්ථානය' පිළිබඳ සීමාවන් නැත. ඔවුන්ගේ නිදහස බැහැර සිට සේවයට එන අයගේ හා අර්ධ කාලීනව සේවය කරන අයගේ නිදහසට වඩා අඩු ය.

6 ''අධික ගාස්තු හා කොමිස්, පිටත් වීමට පෙර වංචා හා රැවටිලි, කොන්ත්‍රාත් උල්ලංඝනය හෝ වෙනස් කිරීම, ගමන් බලපත්‍රය තමන් භාරයේ තබා ගැනීම, වැටුප් නො ගෙවීම, සේවය සඳහා ගිය රටේ අතරමං වීම, ජාවාරම්කරුවන් විසින් දේශසීමා හරහා රැගෙන යාම, අධික වැඩ කාලය, ආහාර හා සන්නිවේදනය සීමා කිරීම, වාචික, ශාරීරික හා ලිංගික අපචාර ඇතැම් වැඩ කරන ස්ථානයක බිහිසුණු මට්ටමක තිබේ. (Economic Review, ඔක්තෝබර් / නොවැම්බර්, 2012: ආර්ථිකයේ කාන්තා සහභාගිත්වය, මහාචාර්ය ස්වර්ණා ජයවීර)

මැද පෙරදිග නිවෙස් බොහොමයක ඉවුම් පිහුම්, පිරිසිදු කිරීම් හා ළමයින්, වැඩිහිටියන් රැක බලා ගැනීම් වැනි අත්‍යවශ්‍ය ගෙදරදොර කටයුතු සඳහා ගෘහ සේවිකාවන් යොදා ගැනේ. ස්වදේශිකයෝ ඒ වැඩ කර ගැනීමට කැමැත්තක් නො දක්වති (Smith, 2010, p 381අනුව Jureidini, 2004; Sabban, 2004) තමන්ගේ පවුල මෙන් ම තමන් සේවය කරන ස්ථානයේ පවුල රැක බලා ගැනීම හා සම්බන්ධ සුවිසල් වගකීමක් දරන මුත්, ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන්ට සේවය කරන රටේදී හිමි වන්නේ ඉතා පහත් ශ්‍රම තත්ත්වයකි.

රැකවරණ ආර්ථිකය (Care Economy) කම්කරු නීති රීතිවලට අදාළ කරගෙන තිබෙන්නේ ඉතා මඳ වශයෙනි. ගෘහස්ථ ශ්‍රමිකයෝ සාමාන්‍යයෙන් කම්කරු නීතිවලින් බැහැර කෙරෙති. ඔවුන්ට සතියේ විවේක දින, වැඩ කරන පැය ගණන, වන්දි ආදී හිමිකම් ලැබෙන්නේ නැත. චින් (1997) විසින් හඳුනා ගන්නා ලද ආකාරයට ගෘහස්ථ ශ්‍රමය යනු ඵලදායී නො වන කාර්යයක් ය යන පීතෘමූලික ආකල්පය හේතුවෙන් ගෘහස්ථ ශ්‍රමය බොහෝ රටවල නීතිගත වී නැත. 2010 පෙබරවාරි තරම් මෑතකදී ලවා කුවේටයේ නීති සම්පාදකයෝ පුද්ගලික අංශය වෙනුවෙන් නව කම්කරු නීති සම්මත කරද්දී ගෘහස්ථ ශ්‍රමය නො තකා හැරිණි (හියුමන් රයිට්ස් වොච්, 2010 ඒ).

ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වන බොහෝ කාන්තාවෝ එයින් ලැබෙන ආදායම මත අධික ලෙස රඳා පවතිති. මක් නිසාද යත්, එය සාමාන්‍යයෙන් තම නිවසේ එක ම ආදායම වන බැවිනි. බොහෝ දෙනෙක් සිය විදෙස් ගමන වෙනුවෙන් අධික ලෙස ණය වී සිටිති. එබැවින් පහත් තත්ත්වයන් යටතේ පවා වැඩ කිරීමට ඔවුහු පෙළඹෙති. කලින් ගිය ගෘහ සේවිකාවන්ගේ අත්දැකීම් පිළිබඳ වාර්තා ඕනෑ තරම් තිබියදීත්, සවුදි අරාබියේ රැකියා සඳහා පිටත් වන කාන්තාවන් සංඛ්‍යාව තවමත් ඉහළ මට්ටමක පවතින්නේ ඒ නිසා ය (Silvery, 2004).

ලංකාවේ කාන්තා සංක්‍රමණික කම්කරු ජනගහණයෙන් 90%කට වඩා අඩු කුසලතා සහිත අයයි. ඔවුහු පුහුණු ශ්‍රමිකයන්ට වඩා පිටරටදී ගැටලුවලට මුහුණ පාති. විශේෂයෙන් ම ගෘහ සේවිකා ප්‍රවර්ගයට අයත් වන අඩු කුසලතා රැකියා සඳහා යන කාන්තාවන් අධෛර්ය කිරීම සඳහා පියවර ගැනීමට රජය පෙළඹුණේ මම සංදර්භය තුළයි (de Silva, 2010). ඒ හා සමපාතව, පුහුණු පිරිමි ශ්‍රමිකයන් පිටරට රැකියා සඳහා යාම දිරිගැන්වීමේ වැඩසටහන් ද දියත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස පිරිමි සංක්‍රමණිකයන්ගේ ඉහළ යාමක් දක්නට ලැබේ. එම ප්‍රවණතාව අනාගතයේදී ද පවතිනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය.

විදේශ රැකියා හේතුවෙන් සැලකිය යුතු විදේශ විනිමයක් රටට ලැබෙනමුත්, විශේෂයෙන් ම මව්වරුන් වැනි කාන්තාවන් විදේශ රැකියාවලට යාම හේතුවෙන් දරන්නට සිදු වෙන සමාජ පිරිවැය අධික බවට තර්කයක් ඇත. එසේම, නුපුහුණු ශ්‍රමයට ගෙවනු ලබන වැටුප් ද පහත් මට්ටමක තිබේ. ශ්‍රම වෙළඳපොළෙහි ඔවුන්ගේ

කේවල් කිරීමේ හැකියාව ද අවම ය (SLBFE, 2011 *Annual Report*). ඉහළ කුසලතා ඇති ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා පිටත් වීම දිරි ගැන්වීමටත්, දරුවන් සිටින මව්වරුන් රැකියා සඳහා විදේශගත වීම අධෛර්යය කිරීමටත්, ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය හා විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය පියවර ගනිමින් සිටින්නේ ඒ නිසා ය. වයස අවුරුදු පහට අඩු දරුවන් සිටින මව්වරුන් ගෘහ සේවිකා රැකියා සඳහා විදේශගත වීම වැළැක්වීමට සැලසුම් / උපායන් ඇති බවට මාධ්‍ය  වාර්තා පළ විය. ළමයින් පාසල් නො යාම, නිසි පෝෂණය නො ලැබීම නිසා සෞඛ්‍ය ගැටලු ඇති වීම, දරුවන් රැක බලා ගත යුතු ඥාතීන් හා බීමත් පියවරුන් විසින් දරුවන් ලිංගිකව හා ශාරීරිකව හිංසනයට ලක් කිරීම වැනි ගැටලු ගැන වාර්තා පළ විණි. ශ්‍රී ලාංකිකයෝ සාමාන්‍යයෙන් තම අනාගත පරම්පරා රැක බලා ගැනීම ගැන ඉතා සංවේදී ය. පවුලේ මව වෙනත් රටක පවුලක් බලා කියා ගනිමින් සිටියදී ඇගේ ම පවුල රැක බලා ගන්නේ කවුරු ද? මව්පියන් නැති වීම දරුවන්ට මානසිකව බලපාන ආකාරය පිළිබඳව ද මාධ්‍ය වාර්තා ඇත. වයඹ පළාතේ පමණක් මෙවැනි මානසික ගැටලු වලට මුහුණ දෙන දරුවන් 1250ක් සිටින බව වාර්තා වී තිබිණි. වාර්තාවේ තව දුරටත් දැක්වෙන පරිදි, සීයලා ආච්චිලාගේ රැකවරණයට පත් කරනු ලබන දරුවන් ලිංගික හිංසනවලට, ව්‍යභිචාරයේ හෝ මත්ද්‍රව්‍යවල ගොදුරු බවට පත් වෙති (*Daily Mirror,* 2012[7])

මෙවැනි අවස්ථාවල දී දරුවන්ගේ ජීවිත පරදුවට තබා තමන් විසින් කරනු ලබන ධනය රැස් කිරීමේ තේරුමක් තිබේදැයි කියා සිතන්නට බොහෝ සංක්‍රමණික මව්පියවරු පෙළඹෙති. එහෙත් මෙහිදී සිහිපත් කළ යුතුව තිබෙන තවත් කරුණක් වන්නේ දරුවන් මෙසේ අනාරක්ෂිත වීමට තිබෙන එකම හේතුව මව්පියන් විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීම නො වන බවයි. එහෙයින් මව්වරුන් විදෙස් රැකියා සඳහා සංක්‍රමණය වීම වැළැක්වූ පමණින් මෙම ප්‍රශ්නයට විසඳුම් ලැබෙන්නේ නැත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වයස අවුරුදු පහට අඩු දරුවන් සිටින මව්වරුන් විදෙස් රැකියාවලට යාම වැළැක්වීමේ යෝජනාව ගෙන ආ අවස්ථාවේ එය මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙස සලකා විරෝධය පළ විය. පසුව මේ සඳහා ගෙන එන ලද සංශෝධනයකට අනුව, විදේශ රැකියා සඳහා සංක්‍රමණය කිරීමට අදහස් කරන මව්වරුන් විසින් තමන් නැති කාලයේදී දරුවන්ට රැකවරණය ලබා දීමට වගකිවයුතු භාරකරුවකු සිටින බවට සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. මේ අනුව, කාන්තා ශ්‍රමිකයන්ට රැකියා සඳහා විදේශගත වීමට පෙර සිය පවුල් වටපිටාව ගැන වාර්තාවක් ඉදිරිපත් කිරීමට සිදු වේ (Mudugamuwa, 2013). විදේශගත වීමට බලාපොරොත්තු වන කාන්තාව වයස අවුරුදු පහට අඩු ළමයින් සිටින මවක්

---

7 http://dailymirrorepaper.newspaperdirect.com/epaper/showarticle.aspx?article=b93bf808-082f-4870-aeba-869b7b064228&key=jXALuI5%2bsKXv%2ffH82OwlqA%3d%3d&issue=86102012072400000000001001

නම්, ඇය නැති කාලයේ ඒ දරුවන් රැක බලා ගන්නා ආකාරය වාර්තාවේ සඳහන් විය යුතු ය (එම).

ප්‍රශ්නය කෙරෙහි සමාජ සංවේදීතාව වැඩි වෙමින් තිබෙද්දී, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය එක්ව අඩු කුසලතා රැකියා සඳහා කාන්තාවන් සංක්‍රමණය වීම අවම කිරීමටත්, වැඩිපුර පිරිමින් සංක්‍රමණය වීම දිරි ගැන්වීමටත් යෝජනා ඉදිරිපත් කළේ ය. ලංකාවේ කාන්තා ශ්‍රමිකයන් ආරක්ෂා කර ගැනීමේ අරමුණ අගය කළ හැකි මුත්, එවැනි ක්‍රියාමාර්ගවල ඇති ගැටලු ද අධ්‍යයනය කළ යුතු ය. නිදසුනක් ලෙස එම රටවලට පිරිමි ශ්‍රමිකයන් අවශ්‍ය ද යන ගැටලුව මතු වේ. කාන්තාවන් සංක්‍රමණය වීම සීමා කළහොත්, ලංකාවේ ඉතිරි වන එම ශ්‍රම බලකාය උරා ගැනීම සඳහා රැකියා අවස්ථා ලංකාවේ තිබෙනවාද? කාන්තා ශ්‍රමිකයන්ගේ සංක්‍රමණය නැවැත්වීමට හෝ අධෛර්යය කිරීමට උත්සාහ කරනවා නම්, ඔවුන්ට ඒ වෙනුවට විකල්ප සැපයීම ද කළ යුතු ය. පහත පරිච්ඡේදයෙන් ඇතැම් යෝජිත ප්‍රතිපත්ති සලකා බලනු ලැබේ.

## 5. ප්‍රතිපත්තිමය බලපෑම්

කලින් ද සඳහන් කරන ලද පරිදි, පසුගිය දශක තුනේ දී ගල්ෆ් කලාපයේ තාවකාලික රැකියා අවස්ථා විවෘත වීමත් සමගම ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු වන ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය ඉහළ ගියේ ය. පසුගිය කාලය තුළ විදේශ රැකියා විසින් උපයන විදේශ විනිමය දේශීය විරැකියාවට විසඳුමක් විය. දේශීය ශ්‍රම වෙළඳපොළ තුළ සක්‍රිය බලවේගයක් නො වන්නට ඉඩ තිබුණු කාන්තාවන් බොහෝ පිරිසකට විදේශ රැකියා ලැබිණි. ඔවුන්ට කලින් අවස්ථාව තිබුණේ අඩු වැටුප් ගෙවන රැකියාවලට හා දේශීය ගෘහ රැකියාවන්ට පමණි.

පරිපාලන හා නීතිමය විධිවිධාන තිබිය දී පවා ශ්‍රී ලංකාව විදේශ රැකියා ක්ෂේත්‍රයේ අභියෝග රැසකට මුහුණ දෙයි. ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන ම අභියෝග වන්නේ ශ්‍රම සංක්‍රමණයන් වැඩි හරියක් අඩු කුසලතා අවශ්‍ය කාන්තාවන් විසින් වැඩිපුර නියැලෙන රැකියා වීම, එමගින් ආරක්ෂාව පිළිබඳ ඇති වන ප්‍රශ්න, වැටුප් අඩු නිසා ආදායම අඩු වීම, ගල්ෆ් කලාපය වැනි සීමිත රටවල් සංඛ්‍යාවක රැකියා නියුක්තිය මත රඳා පැවතීම ආදියයි. මෙම ගැටලුවලට විසඳුම් ලබා දීම පිණිස, ශ්‍රම සංක්‍රමණයේ ඇති වැදගත්කම හඳුනා ගන්නා ගමන් ම, ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය එක්ව යෝග්‍ය රැකියා සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් හා ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තියක් 2009 දී සකසන ලදී. යෝග්‍ය රැකියා සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ''යෝග්‍ය රැකියා ජාතික යථාර්ථයක් බවට පත් කිරීම සඳහා මාර්ග සැලසුම'' නම් විය. මෙම ප්‍රතිපත්ති ලේඛන විදේශ රැකියා සම්බන්ධයෙන් 'ආරක්ෂිත, පුහුණු සංක්‍රමණයක්' අවධාරණය කරන දස අවුරුදු ජාතික සැලැස්මක කොටසකි. වසර හතරක් පසු

වෙමින් තිබියදී පවා අදාළ දෙපාර්තමේන්තු හා අධිකාරීන් විසින් කරමින් සිටින්නේ මෙම වාර්තාවේ ඇතැම් යෝජනා හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමයි. කාන්තා ශ්‍රම සංක්‍රමණය සම්බන්ධ බොහෝ ප්‍රතිපත්තිමය වෙනස්කම් ඉක්මන් කෙරුණේ 2013 වසරේදී රිසානා නෆීක් මරණීය දණ්ඩනයට ලක් වීමත් සමගයි.

දේශීය, රාජ්‍ය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ දෘෂ්ටි කෝණයෙන් සලකා බැලූ කල විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීම හා පිටරටදී දේශීය කම්කරුවන් ආරක්ෂා කිරීම අතර සියුම් සමබරකම නඩත්තු කිරීම යනු නිරන්තර අභියෝගයකි. පහත දැක්වෙන ඇතැම් මුලපිරීම් මාධ්‍යවල වාර්තා වූ අතර, ඒ හැම එකක් ම (මෙය ලියන මොහොතේ) නීති බවට පත් වී නැත. ඒ නිසා වෙනස් වීමට ඉඩ තිබේ.

විශේෂයෙන් ම ගෘහ සේවිකාවන් වැනි ගෘහස්ථ කම්කරු ගණයට අයත් වන ශ්‍රමික කාන්තාවන් අනතුරට පාත්‍ර වීම පිළිබඳ ඇති විවිධ වාර්තා හේතුවෙන්, 2020 වන විට සංක්‍රමණය කරන කාන්තාවන් සංඛ්‍යාව 80% - 90% අතර ප්‍රමාණයකින් අඩු කරන්නට සැලසුම් සකසා ඇති බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පවසයි (Daily Mirror, January 03, 2013 සහ Daily News, January 14, 2013). ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එසේ කරන්නේ නම්, වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග එක්ව, ඔවුන් සඳහා ප්‍රමාණවත් තරම් රැකියා දේශීයව නිර්මාණය කිරීමට කටයුතු කිරීමේ වගකීමක් ඔවුන්ට තිබේ.

කාන්තා ශ්‍රම සංක්‍රමණයන් වහාම හෝ කෙටි කාල පරිච්ඡේදයක් තුළ නතර කළ නොහැකි බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් හඳුනාගෙන තිබේ. එබැවින් කාන්තාවන් රැකියා සඳහා විදේශගත වීම අධෛර්යය කරන ගමන් ම කාන්තා ශ්‍රම සංක්‍රමණිකයන්ගේ කුසලතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන් ද දියත් කර තිබේ. විධිමත් සේවා ගිවිසුම් හරහා ඔවුන්ට ඉහළ වැටුප් හා ආරක්ෂාවක් සහතික කිරීම එහි අභිප්‍රායයි. 2012 සැප්තැම්බර් 01දා සිට, ගෘහ සේවිකාවන් ලෙස සංක්‍රමණය කිරීමට අදහස් කරන කාන්තාවන් ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයේ තුන්වන මට්ටම ලබා ගත යුතු ය. එමගින් ඔවුන් ගෘහස්ථ ගෘහ පාලන සහායකයින් ලෙස වර්ග කරනු ලැබේ (Daily News, 2012; Mudugamuwa, 2013). මෙම සහතිකකරණය මගින් මෙම කාන්තාවන්ට ඉහළ වැටුපක් හා වඩා හොඳ ශ්‍රම තත්ත්වයක් ගිවිසුම් ගත කර ගැනීම සඳහා අවස්ථාව ලැබේ. විදේශ රැකියා ප්‍රවර්ධන ඇමති ඩිලාන් පෙරේරා පවසන පරිදි (Mudugamuwa, 2013), අදාළ සහතිකය හා රැකියා වෙනස හේතුවෙන් සවුදියේ ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ වැටුප රියාල් 900 දක්වා වැඩි වේ. දැනට මෙම තත්ත්වය පවතින්නේ සවුදි අරාබියේ පමණක් වුවත්, ලබන වසරේ එය අනෙක් රටවලට ද හඳුන්වා දෙනවා ඇත (එම). මෙම කුසලතා සංවර්ධනය සේවයේ යෙදෙන රටෙහි ඉල්ලුම සමඟ පෑහෙන්නේ ද යන්න මෙම සංක්ෂිප්ත වාර්තාවේ දී සැලකිල්ලට ගන්නේ නැත. එහෙත්, එය ක්ෂේත්‍රයේ සියලු වගකිවයුත්තන් සිත්හි තබා ගත යුතු ය. ගෘහස්ථ කම්කරුවන් ලෙස සංක්‍රමණය

වන කාන්තාවන්ගේ කුසලතා මට්ටම වැඩි දියුණු කිරීමෙන් ඔවුන් රෝහල් සේවා, හෝටල් සේවා හා වෙළඳ වැනි අංශ වෙතට ද විවෘත වෙති.

ඉහළ කුසලතා මට්ටමකට සපැමිණීම පිණිස සංක්‍රමණිකයන් කිසියම් අධ්‍යාපනයක් හා වෘත්තීය පුහුණුවක් ලැබීම අත්‍යවශ්‍ය ය. එහෙත්, සංක්‍රමණය වීමට අදහස් කරන සැමට මෙබඳු පුහුණුවක් ලබා ගැනීමේ පහසුකම් නැත. පුහුණුව සඳහා කාලය ගත වන අතර, ඇතැමෙකුට එසේ කාලය කැප කිරීමේ හැකියාවක් නැත. මෙවන් තත්ත්වයක සිටින අයට එවැනි පුහුණු වීමක තිබෙන වැදගත්කම අවබෝධ කර දිය යුතු ය. එමගින් ඔවුන්ට වඩා හොඳ වැටුප් හා සේවා තත්ත්වයන් මෙන්ම රටට වැඩි විදේශ විනිමයක් අත්පත් කරගත හැකි බව ඒත්තු ගැන්විය යුතු ය. අතීතයේ දී තාක්ෂණ හා වෘත්තීය පුහුණු වැඩසටහන්වල තත්ත්වය දුර්වල වූ බව හා දිවයින පුරා පුහුණු මධ්‍යස්ථානවල දී එක ම අන්දමින් පුහුණු නො කරන ලද බව සටහන් කළ යුතු ය (ILO, 2009). මෙම තත්ත්වයන් වැඩි දියුණු නො කළොත් හා ප්‍රමිතීන් නඩත්තු නො කළහොත්, එමගින් ශ්‍රී ලාංකික ශ්‍රම සංක්‍රමණිකයන්ට ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළේ දී වැටුප් හා සේවා තත්ත්වයන් පිළිබඳ එතරම් කේවල් කිරීමේ හැකියාවක් ලැබෙන්නේ නැත. මන්ද, ඔවුන්ට සහතික තිබුණත්, ඇත්ත කුසලතා නැති බැවිනි.

කාන්තා ශ්‍රම සංක්‍රමණය අධෛර්යය කරන ගමන් ම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඉහළ කුසලතා ඇති පිරිමි සංක්‍රමණිකයන් සංඛ්‍යාව වැඩි කිරීමට ද පියවර ගෙන තිබේ. විදේශ රැකියා සඳහා මැදපෙරදිග රටවල් මත රඳා පැවැත්ම අවම කිරීම සඳහා අලුත් රටවල රැකියා ද, වෘත්තීය පුහුණු වැඩසටහන් ද ප්‍රවර්ධනය කරනු දක්නට ලැබේ. එහෙත්, විදේශ රැකියා අපේක්ෂිතයන්ට අවශ්‍ය පුහුණුව හා අවස්ථා විවර කර දෙන මෙවැනි පුහුණු මධ්‍යස්ථාන කොළඹට හා ආසන්න දිස්ත්‍රික්කවලට සීමා වී තිබේ (Ministry Of Labour Relations and Manpower, 2009). පරිවාරයේ දිස්ත්‍රික්කවල වෙසෙන ජනයාට මෙම පහසුකම් වෙත පිවිසීම දුෂ්කර ය. ගෘහ සේවිකාවන් පුහුණු කරන මධ්‍යස්ථාන නම් රට පුරා පිහිටා තිබේ. එහෙත්, මෙම මධ්‍යස්ථාන එසේ නො වේ. වෘත්තීය පුහුණුව හා විකල්ප රැකියා අවස්ථා දිරි ගැන්වීමට අවශ්‍ය නම්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා වෙනත් අදාළ ආයතන විසින් මෙවැනි විකල්පයන් සඳහා තිබෙන ඉල්ලුම තක්සේරු කර අවශ්‍ය අංශවල පුහුණු අවස්ථා ලබා දිය යුතු ය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2012 වාර්ෂික වාර්තාව අනුව, ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ ප්‍රධාන වෙළඳපොළ මැදපෙරදිග රටවල් වේ. 2012 වසරේ සමස්ත සංක්‍රමණිකයන්ගෙන් 94.4%ක් ම ගියේ එහි ය. ඒ අතරිනුත් බහුතරය කාන්තාවෝ ය. මැද පෙරදිග රටවල් මත රඳා පැවතීම අවම කිරීම පිණිස සීෂෙල්ස්, සයිප්‍රස්, දකුණු කොරියාව, හොං කොං හා සිංගප්පූරුව වැනි නව දේශයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගෙන තිබේ (Somarathna, 2012; Bandara, 2013). සීෂෙල්ස් විශේෂයෙන් ම, අධ්‍යාපනය,

නීතිය, සෞඛ්‍යය හා සත්කාරක කර්මාන්තය වැනි ඉහළ කුසලතා අවශ්‍ය ක්ෂේත්‍රවල රැකියා අවස්ථා ඇති රටකි. එහෙත් 2012 මහ බැංකු වාර්තාව විසින් පෙන්වා දෙන ලද ආකාරයට, එම වසරේදී කලින් වසරට සාපේක්ෂව, මැදපෙරදිග නො වන වෙනත් රටවලට ශ්‍රම සංක්‍රමණය සඳහා පිටත් වීම අඩු වී තිබේ. එමගින් විදේශ රැකියා වෙනුවෙන් මැදපෙරදිග රටවල් මත රඳා පැවැත්ම අඛණ්ඩව පවතින බව පෙන්නුම් කෙරේ යයි වාර්තාවේ සඳහන් වේ.

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය ද කාන්තා සංක්‍රමණිකයන් අධෛර්යය කිරීම සඳහා පියවර ගෙන තිබේ. ඒ සංක්‍රමණිකයන් සඳහා අවම වැටුප ඉහළ නැංවීමෙනි. 2013 මැයි සිට බල පැවැත්වෙන නව රෙගුලාසි අනුව, සවුදි අරාබියේ රැකියාවලට යන කාන්තාවන් අවම වශයෙන් වයස අවුරුදු 25ක් විය යුතු ය. වෙනත් මැද පෙරදිග රටවල් සඳහා අවම වයස අවුරුදු 23 කි. සිංගප්පූරුව, හොං කොං, මැලේසියාව, සයිප්‍රසය හා වෙනත් රටවල් සඳහා අවම වයස අවුරුදු 21 කි. රජයේ ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල පවසන පරිදි, ඉහළ අවම වයසක් නියම කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කාන්තා ශ්‍රම සංක්‍රමණය නතර කර දැමීමයි (Al Jazeera, 2013).

බොහෝ ප්‍රතිපත්තිවල අරමුණ නුපුහුණු කාන්තා ශ්‍රමිකයන් සංක්‍රමණය වීම අඩු කිරීම හෝ අධෛර්යය කිරීමයි. මෙයට හේතු වන්නේ ඔවුන් ගෘහ සේවිකාවන් ලෙස අනතුරුවලට භාජනය විය හැකි තත්ත්වයක සිටීම හා ඉහළ කුසලතාවන් මත සංක්‍රමණය කරන ශ්‍රමිකයන් උපයන මුදල හා සාපේක්ෂව බැලූ කල ඔවුන් උපයන ආදායම ඉතා අවම වීමයි. කාන්තා ශ්‍රම සංක්‍රමණිකයන් අධෛර්ය කිරීමට පියවර ගැනීම අගය කළ හැකි ය. එහෙත්, ඒ ගමන් ම ශ්‍රමය වෙනුවෙන් සංක්‍රමණය කිරීමේ තීරණයට එළඹෙන කාන්තාවන් ආරක්ෂා කර ගැනීම සඳහා නව නිර්මාණාත්මක ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය ය. ශ්‍රම සංක්‍රමණිකයන්ගේ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීමට සමත්, ප්‍රමාණවත් කාර්ය මණ්ඩල ලාංකික ශ්‍රම සංක්‍රමණිකයන් සේවය කරන රටවල තානාපති කාර්යාලවල සේවයේ යෙදවිය යුතු ය.

සංක්‍රමණික කාන්තාවන්ට හා ඔවුන්ගේ පවුල්වලට සිදු වන අහිතකර බලපෑම අවම කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විසින් පියවර රැසක් ගෙන තිබේ. ඒ අතර 'විදේශ රැකියා' නම් වන රක්ෂණ ක්‍රමයක් ද, රාජ්‍ය බැංකු සමග එක්ව ක්‍රියාත්මක කරන සහන පොළී නිවාස හා වෙනත් ණය ද, සංක්‍රමණික කම්කරුවන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ද, අසනීප වී ආපසු එන ශ්‍රමිකයන්ට වෛද්‍ය පහසුකම් ද වේ (Central Bank, 2012). මේ කුමන ක්‍රියාමාර්ගය ගත්තත්, සංක්‍රමණික කම්කරුවන් සංඛ්‍යාව සුවිසල් නිසා එහි සියලු සමාජ පිරිවැය දුරලීමට නො හැකි ය. තමන්ට තිබෙන අවස්ථා පිළිබඳව සියලු සංක්‍රමණිකයන් දැනුවත් නො වන්නට ද ඉඩ තිබේ. කොළඹින් බැහැර ප්‍රදේශවල ක්‍රියාත්මක නො වීමත්, සැලසුම් කිරීමේ හා සම්බන්ධීකරණයේ ගැටලුත් හේතුවෙන් මෙම වැඩසටහන්වල ඵලදායිතාවත්,

ඒවා වෙත පිවිසීමේ හැකියාවත් සීමා වී තිබේ (Ministry Of Labour Relations and Manpower, 2009). මෙම අඩුපාඩු මගහරවා ගැනීම පිණිස එම සේවාවන් සපයන ප්‍රජා පාදක සංවිධාන, රාජ්‍ය නොවන අංශය හා බඳවා ගැනීමේ නියෝජිතායතන සමග එක්ව වැඩ කිරීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට හැකි ය. මෙමගින් අපේක්ෂිත සංක්‍රමණිකයන්ට හා ඔවුන්ගේ පවුල්වලට අවශ්‍ය සේවා සම්පාදනය වඩා හොඳින් සම්බන්ධීකරණය කර ගත හැකි ය.

තවත් වැදගත් කරුණක් වන්නේ මේ සේවා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි සංක්‍රමණිකයන්ට පමණක් සීමා වේ නම්, එසේ ලියාපදිංචි නො වන ශ්‍රමිකයන්ගේ තත්ත්වය කුමක් ද යන්නයි. සියලු අපේක්ෂිත සංක්‍රමණිකයන් රක්ෂණ ක්‍රමය, ණය ආදිය ගැන දැනුවත්ව සිටියේ නම්, ඔවුන්ට වඩා හොඳ සමස්ත විදේශ රැකියා අත්දැකීමක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වීම දිරිමත් කරන්නට තිබුණු බවට තර්ක කළ හැකි ය. දැනුවත් සංක්‍රමණය මේ සඳහා ඇති මාර්ගයයි. සියලු ශ්‍රම කම්කරුවන් වෙත ළඟා වීම දුෂ්කර කාර්යයක් නම්, ශ්‍රම සංක්‍රමණ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන අය දැනුවත් කරන්නට පුළුවන. සෑම දිස්ත්‍රික්කයක ම හා ශ්‍රම සංක්‍රමණය වැඩියෙන් සිදු වූ ඉතිහාසයක් තිබෙන කොට්ඨාසවල ශ්‍රම සංක්‍රමණ සේවා / තොරතුරු මධ්‍යස්ථාන පිහිටුවීමට පුළුවන. සපයනු ලබන තොරතුරු සංක්‍රමණ ක්‍රියාවලියට පමණක් සීමා නො විය යුතු ය. සංක්‍රමණය වීමට අපේක්ෂා කරන ශ්‍රමිකයන් ඔවුන්ගේ හිමිකම් හා තමන් සේවය කරන රටේ දී තිබෙන බැඳීම් ගැන ද දැනුවත් කිරීමෙන් ඔවුන් සූරාකෑමට ලක් වීම අඩු කළ හැකි ය.

කෙටි කාලීන ශ්‍රම සංක්‍රමණයන්ගෙන් පසුව ආපසු ඒමට අවශ්‍ය සංක්‍රමණිකයන් වෙනුවෙන් අනාගත ප්‍රතිපත්ති තහවුරු කිරීම ද වැදගත් ය. මෙම ශ්‍රමිකයන් නැවත දේශීය ශ්‍රම වෙළඳපොළට සම්බන්ධ කිරීමේ වැඩසටහන් රජය විසින් සංවර්ධනය කළ යුතු ය. එසේ නො වුවහොත්, ඔවුන් ආපසු පැමිණීමෙන් පසුව ආදායමක් උපයා ගන්නටත්, තමන් විසින් විදේශයන්හිදී ගොඩනගා ගන්නා ලද කුසලතා භාවිත කරන්නටත් ඔවුන්ට අවස්ථාවක් ලැබෙන්නේ නැත. දිගු කාලීනව තමන්ට එලදයී වන ආකාරයෙන් තමන් ඉපැයූ මුදල ඉතිරි කර ගන්නා ආකාරය ගැන ද ඔවුන්ට පුහුණුව / තොරතුරු සැපයිය යුතු ය. තමන් පිටරට දී වූ වෙහෙස අපතේ යවමින්, සංක්‍රමණිකයන් නැවත දිළිඳුභාවයට, විරැකියාවට හා අඩු වැටුප් කුලී වැඩට ඇද වැටෙන ආකාරයට උපයා ගත් මුදල් නාස්ති කර ගත් හා දුර්වල අන්දමින් ආයෝජනය කර ගත් සිද්ධි රැසක් වාර්තා වී තිබේ (Jayaweera, 2012). ආපසු පැමිණීමෙන් පසුව වෙනත් ජීවනෝපායක් නැතිකම නිසා ගැටලු රැසකට මුහුණ දීමට සිදු වන ගෘහ සේවිකා සංක්‍රමණිකයන්ට තම ඉතුරුම් පරිස්සම් කර ගැනීම හා ආයෝජනය කිරීම ගැන උපදෙස් දීම ඉතා වැදගත් ය. එසේ නො වූ විටදී එම කාන්තාවන්ට නැවත වතාවක් සංක්‍රමණය වීම හැර වෙනත් විසඳුමක් නැති වේ.

## 6. නිගමනය

කාන්තා ශ්‍රම සංක්‍රමණිකයන්ගේ සුබසාධනය වෙනුවෙන් ගන්නා සෑම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයක්මත්, පනවනු ලබන සීමාවක්මත් අගය කළ හැකි මුත්, මෙහිදී රජය ඉවසිලිවන්ත වීම අවශ්‍ය ය. ඉහළ අවම වැටුපක් නියම කිරීම, වයස් සීමාවන් නියම කිරීම හා සංක්‍රමණය කළ හැකි රටවල් සීමා කිරීම වැනි නියාමනයන් ශ්‍රම සංක්‍රමණය එකම ආදායම් මාර්ගය වන අයට අහිතකර ලෙස බල පෑ හැකිය. 2013 ජනවාරි 26 දින BUSINESS MIRROR හි පළ වූ ලිපියකට අනුව, ඉන්දුනීසියානු හා පිලිපීන ගෘහස්ථ කම්කරුවන් හිඟ වූ විට සවුදි අරාබිය කළේ ඉතියෝපියාවෙන් ගෘහස්ථ කම්කරුවන් සපයා ගැනීමයි. ඔවුන්ට සවුදි අරාබියේ සේවය කිරීමෙන් ඉතියෝපියාවේ දී උපයනවාට වඩා මුදලක් උපයා ගැනීමට හැකි ය. විදේශ ගෘහස්ථ කම්කරු සේවය සඳහා සංක්‍රමණය කිරීම සීමා කිරීම සඳහා පියවර ගැනීමට පෙර විදේශ රැකියාවන්ට යන ශ්‍රමිකයන්ට දේශීයව විකල්ප තිබෙන බවට වග බලා ගැනීම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ වගකීමකි. මැද පෙරදිග රටවල හාම්පුතුන්ට ශ්‍රී ලාංකික ගෘහස්ථ කම්කරුවන් සපයා ගැනීම කරදරකාරී කාර්යයක් ලෙස හැඟේ නම්, ඔවුන් කරන්නේ වෙනත් රටක් දෙසට හැරීමයි. එබැවින් සෑම වසරක ම විදේශ ගෘහ සේවය රැකියාව ලෙස තෝරා ගන්නා ලක්ෂයක් පමණ වූ දෙනා පිළිබඳ වැදගත් වන තීරණ ගැනීමේදී පරිස්සමෙන් එසේ කිරීම වැදගත් ය.

2012 වසරේ මැනිලාහි පැවති සංක්‍රමණය පිළිබඳ 5 වන ලෝක සමුළුවේදී ප්‍රකාශිත පරිදි සංක්‍රමණිකයන් ආරක්ෂා කර ගැනීමට ඇති වඩාත් ම ඵලදායී ක්‍රමය වන්නේ රටක් තුළ ''සංක්‍රමණය වීමේ අයිතිය තිබිය දී සංක්‍රමණය නො වී සිටීමේ ද අයිතිය පවතින බව'' තහවුරු කිරීම සඳහා අවශ්‍ය සමාජ දේශපාලන ක්‍රියාමාර්ග තනි තනිව නොව සාමූහිකව ගැනීමයි (Migrant Forum in Asia, 2012). එය සිදු විය යුත්තේ කැමත්ත පරිදි ය.

# විමර්ශන


Al Jazeera, 2013. 'Sri Lanka to ban maids going to Saudi Arabia'. *Al Jazeera*, 25 January 2013. Online <http://www.aljazeera.com/news/asia/2013/01/20131252517879813.html>

Amnesty International, 2007. *Indonesia: Exploitation and Abuse: The Plight of Women Domestic Workers.* London: Amnesty International. Online. <http://www.amnesty.org/en/library/info/ASA21/001/2007>

Bandara, S. A., 2013. 'Plenty of job opportunities for Lankans abroad', *Daily News,* 5 March 2013. Online. <http://www.dailynews.lk/2013/03/05/news36.asp>

Bowatte, A., 2012. *Effects of migration on Jaffna Tamil families.* Working Paper No. 2012/2. London: UCL Migration Research Unit. Online. <http://www.geog.ucl.ac.uk/research/transnational-spaces/migration-research-unit/working-papers/Aishwarya%20Bowatte%202.pdf>

Business Mirror, 2013. Saudis turn to Ethiopian maids after beheading limits supplies. *EthioSun,* 26 January 2013. Online. <http://businessmirror.com.ph/index.php/en/features/global-eye/8264-saudis-turn-to-ethiopian-maids-after-beheading-limits-supplies>

Caritas International, 2010. *The Female Face of Migration,* Background paper. Online. <http://www.acpmigration-obs.org/node/4674>

Central Bank of Sri Lanka, 2012. 'Prices, Wages, Employment and Productivity', *Annual Report, 2012.*. Colombo: Central Bank of Sri Lanka. pp. 97-117. Online.

<http://www.cbsl.gov.lk/pics_n_docs/10_pub/_docs/efr/annual_report/AR2012/English/ content.htm pp 97-117>. Unemployment statistics obtained from http://www.cbsl.gov.lk/pics_n_docs/10_pub/_docs/efr/annual_report/AR2012/English/8_Chapter_04.pdf

Abdul Cader, A. & Mohamad, M., 2009. "Migration and Remittances: assessing the potential to maximise poverty impact." *Opportunities for the Productive Poor: perspectives on agriculture and rural livelihoods in Sri Lanka,* Ishara Rathnayake & Priyanthi Fernando (eds.), 2009. Colombo: Centre for Poverty Analysis. pp 101 – 147. Print.

Chin, C.B.N., 1998. 'The Malaysian-Philippine-Indonesian Maid Trade', *In Service and Servitude: Foreign Female Domestic Workers and the Malaysian "Modernity" Project,* New York: Columbia University Press, pp. 93-124. Print.

De Haan, A. & Yaqub, S., 2009. *Migration and Poverty: Linkages, Knowledge Gaps and Policy Implications,* Geneva: United Nations Research Institute for Social Development. Print

De Silva, W. I., 2010. *Male dominance to female dominance and back to male dominance: the changing nature of international labour migration of Sri Lanka.* Annual Research Proceedings, University of Colombo, 12-13 May 2010. Colombo: University of Colombo. Online. <http://archive.cmb.ac.lk:8080/research/handle/70130/406> accessed from <http://archive.cmb.ac.lk:8080/research/bitstream/70130/406/1/Abstracts%20%28dragged%29%201.pdf>

Dhananjayan Sriskandarajah, 2002. The Migration-Development Nexus: Sri Lanka Case Study, *International Migration* Vol. 40 (5) Geneva: International Organisation for Migration. Online. <http://onlinelibrary.wiley.com/doi/10.1111/1468-2435.00220/abstract>

Gamburd, M.R., 2009. Advocating for Sri Lankan Migrant Workers, *Critical Asian Studies,* Vol.41 (1), Oxford: Routledge Journals, Taylor & Francis Group, pp. 61-88. Print.

Human Rights Watch, 2010. *Rights on the Line: Human Rights Watch Work on Abuses Against Migrants in 2010.* USA: Human Rights Watch. Online. <http://www.hrw.org/en/reports/2010/12/12/rights-line-0>

Institute of Policy Studies of Sri Lanka, 2013. *Migration Profile – Sri Lanka,* Colombo: Institute of Policy Studies. Print.

Ruwan Jayathilaka, R. & Jayawardhana, T, 2009. International Migration Outlook: Sri Lanka 2008. Colombo: Institute of Policy Studies. Print.

International Organization for Migration.International Labour Organization, 2009. Online. <http://www.ilo.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/---ilo-colombo/documents/publication/wcms_155215.pdf>

International Labour Organization, 2013. *Labour Migration.* Online. <http://www.ilo.org/colombo/areasofwork/labour-migration/lang--en/index.htm>

Somarathna, R., 23rd May 2012. 'Skilled overseas jobs: NVQ certificate, a must from Sept 1, 2012', Daily News Online. <http://www.dailynews.lk/2012/05/23/news01.asp>

Jayaweera, S., 2012. 'Marginalization of Women Workers in the Context of Economic Rights' *Economic Review* Oct/Nov, 2012, Vol. 38, (7 & 8), pp. 16-21. . Colombo: People's Bank. Print.

Jureidini, R., 2002. 'Women Migrant Domestic Workers in Lebanon' in *Gender and Migration in Arab States: The Case of Domestic Workers,* Simel Esim & Monica Smith (eds). Pp 63-82. Beirut: International Labour Organisation. Online. <http://www.iiav.nl/epublications/2004/Gender_and_migration_in_arab_states_the_case_of_domestic_workers.pdf#page=64>

*International Migration Programme. Online.* <http://www.ilo.org/public/english/

protection/migrant/download/imp/imp48e.pdf>

KARUNARATNE, H.D., 2008. 'International Labour Migration, Remittances and Income Inequality in a Developing Country: The Case of Sri Lanka'. *Keizai Shirin (The Hosei University Economic*

*Review)* Vol. 75(4), pp. 21-65, Tokyo: Hosei University, Online.

< http://repo.lib.hosei.ac.jp/bitstream/10114/1629/1/75-4hettige.pdf>

World Social Forum, 2012. S*eizing the Moment, Building Solidarity Social Movements in Action at the 5th World Social Forum on Migration.* Migrant Forum in Asia Quezon City. Online. <https://www.dropbox.com/s/ydt5rx6yh0unlwy/WSFM%20report%20final.pdf>

Ministry Of Labour Relations and Manpower, 2009. *Making Decent Work A National Reality- Sri Lanka Road Map*. Supported by the International Labour Organisation. Colombo: Ministry of Labour Relations and Manpower. Online. <http://www.ilo.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/---ilo-colombo/documents/publication/wcms_155215.pdf>

Mudugamuwa, M., 2013. 'Lankan domestics continue to stream into West Asia despite call for ban', *The Island,* 10 July 2013. Online. <http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=83205>

Mudugamuwa, M., 2013. 'Family background report mandatory for females seeking overseas jobs', *The Island,* 24 June, 2013. Online.

<http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=82082>

Ruhunage, L.K., 2007. Labour Migration: Present day Experience in Sri Lanka. *Economic Review: Migration - Issues and Trends*, Vol. 33 ( 4-9), July/December, pp 9-10. Colombo: People's Bank of Sri Lanka. Print.

Silvery, R., 2004. Transnational Migration and the Gender Politics of Scale: Indonesian Domestic Workers in Saudi Arabia, *Singapore Journal of Tropical Geography,* Vol. 25 (2), pp. 141-155. National University of Singapore and Blackwell Publishers. Print.

Smith, M., 2010. Erasure of Sexuality and Desire: State Morality and Sri Lankan Migrants in Beirut, Lebanon. *Asia Pacific Journal of Anthropology.* Vol 11 (3-4), September-December. pp 378-393 The Australian National University and Taylor and Francis. Print.

Somarathna, R., 2012. More jobs for Lankans in Seychelles, *Daily News* on 24 August 2012. Online. <http://www.dailynews.lk/2012/08/24/news32.asp>

Trading Economics, 2013. Net Migration in Sri Lanka. *Trading Economics.* Online. Accessed June 2013, <http://www.tradingeconomics.com/sri-lanka/net-migration-wb-data.html>

UNDP, 2009. *Human Development Report 2009. Overcoming Barriers: Human Mobility and Development.* New York: United Nations Development Programme. Online. <http://hdr.undp.org/sites/default/files/reports/269/hdr_2009_en_complete.pdf>

UNPAC, 2011. *Women and the Economy: Globalization and Migration.* UN Platform for Action Committee Manitoba (UNPAC). Online. <http://www.unpac.ca/economy/g_migration.html>

Wickremesinghe, M. & Jayatilaka W., 2006. *Beyond glass ceilings and brick walls: Gender at the workplace. Colombo:* International Labour Organization. Online. <http://www.ilo.org/public/english//region/asro/colombo/downloads/publications/beyond.pdf>

# වැඩි දුර කියවීම්


Daily Mirror, 2013. 'SL to Cut Down on Maid Exports.' Daily Mirror 03 January 2013 <http://www.dailymirror.lk/news/24712-sl-to-cut-down-on-maid-exports.html?utm_source=twitterfeed&utm_medium=facebook >

Fernando, M., 2012. 'New migratory health policy in the offing' Sunday Observer 02 December 2012. Online. <http://www.sundayobserver.lk/2012/12/02/fea05.asp>

Fernando, M., 2013. 'Meeting to Discuss Labour Migration Policy.' Sunday Observer 13 January 2013. Online. <http://www.sundayobserver.lk/2013/01/13/new20.asp>

Hettige, S., 2013. 'Social and Economic Cost of Brain Drain.' Daily Mirror 17 June 2013 <http://www.dailymirror.lk/opinion/172-opinion/31008-social-and-economic-cost-of-brain-drain.html?utm_source=twitterfeed&utm_medium=twitter>

Human Rights Watch, 2007. 'Sri Lanka: Drop Ban on Mothers Emigrating for Work.' Human Rights Watch 16 March 2007. Online. <http://www.hrw.org/news/2007/03/13/sri-lanka-drop-ban-mothers-emigrating-work>

IRIN, 2010. SRI LANKA: Government Seeks to Boost Migrant Labour Skills, IRIN Asia 09 December 2010 <http://www.irinnews.org/report/91319/sri-lanka-government-seeks-to-boost-migrant-labour-skills>

Lanka Frontline, (a) 2012. Tougher Rules for Hiring Sri Lankan Maids in UAE, Lanka Frontline published on 05 November 2012 <http://en.lankafrontline.com/tougher-rules-for-hiring-sri-lankan-maids-in-uae/>

Lanka Frontline (b) (2013). Empowering Housemaids with Comprehensive Training, Lanka Frontline published on 25 January 2013 <http://en.lankafrontline.com/empowering-housemaids-with-comprehensive-training/>

Lanka Frontline (c) (2013). Males outstrip females reversing earlier trend Expat workers, Lanka Frontline published on 13 June 2013 <http://en.lankafrontline.com/males-outstrip-females-reversing-earlier-trend-expat-workers/>

Mudugamuwa, M. (2013). No Ban on Woman Going Abroad as Maids, The Island published on 21 January 2013 <http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=70899 >

Paranamanna, S. (2012). Migrant Workers' Children Deprived of Proper Care, Info Lanka via Daily Mirror published on 26 September 2012 <http://www.infolanka.com/news/IL/dm789.htm>

Somarathna, R., (2012). Accent on skilled workers for migrant jobs: Moves to reduce females migrating as housemaids, Daily News published on 19 March 2012 <http://archives.dailynews.lk/2012/03/19/news26.asp>

තේමාත්මක සංක්ෂිප්ත පත්‍රිකා

තේමාත්මක සංක්ෂිප්ත

**No. 1 Social Infrastructure and Inclusive Growth**

**No. 2** වෙනස්වන ශ්‍රම සංක්‍රමණය සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිචාර


Centre for Poverty Analysis
29 R G Senanayake Mawatha, Colombo 7, Sri Lanka
Tel: +94(011) 4690200, 2676955
Fax: +94(011) 2676959
Email: info@cepa.lk
Web: www.cepa.lk